ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ஸ்ரீலங்கா சீமெந்துக் கூட்டுத்தாபனம

SRI LANKA CEMENT CORPORATION

වාර්ෂික වාර්තාව හා ගිණුම්

வருடாந்த அறிக்கை மற்றும் கணக்குகள

ANNUAL REPORT AND ACCOUNTS

2018

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

වාර්ෂික වාර්තාව හා ගිණුම්

2018

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව,
නො. 27, වොක්ෂෝල් මන්දිරය,
වොක්ෂෝල් පාර,
කොළඹ - 02.

21.10.2019

ලේකම්තුමා,
කර්මාන්ත හා වාණිජ කටයුතු ,දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම ,සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය,
73/1, ගාලු පාර,
කොළඹ - 03.

ලේකම්තුමනි,

2018 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව හා ගිණුම් - ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තියේ නියමයන්ට අනුකූලව පහත සඳහන් ලේඛන සමග 2018 වර්ෂය සඳහා වූ සංස්ථාවේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමු.

අ) 2018 වර්ෂයේ මුල්‍ය වාර්තා
ආ) විගණකාධිපති වාර්තාව
ඇ) යටෝක්ත (ආ) පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම්

ස්තූතියි.

මෙයට විශ්වාසී,
ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

අත්සන් කලේ,
එස්. සුබයිර්ඩීන්,
සභාපති

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

අන්තර්ගතය **පිටු**

අංකය

01	2018 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව	01 – 04
02	ආයතනික තොරතුරු	05 – 06
03	මානව සම්පත් පිරිස් බලය	07
04	ආයතනයේ සභාපතිතුමාගේ වාර්තාව	08
05	2014 - 2018දක්වා වසර 5ක් සඳහා මූල්‍ය තත්ව ප්‍රකාශනය	09
06	2014 – 2018 දක්වා වසර 5ක් සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය	10
07	විගණන කමිටුවේ වාර්තාව - 2018	11
08	විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව - 2018	12 – 20
09	2018.12.31ට මූල්‍ය තත්ව ප්‍රකාශනය	21
10	2018.12. 31න් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය	22
11	2018.12. 31ට හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය	23
12	2018.12. 31ට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	24
13	2018.12.31න් අවසන් වර්ෂයේ මූල්‍ය වාර්තා සඳහා ගිණුම්කරණ සටහන් හා ප්‍රතිපත්ති	25 – 28
14	2018.12.31න් අවසන් වර්ෂයේ ගිණුම්කරණ සටහන් සඳහා සවිස්තරාත්මක සටහන්	29 – 35
15	2018 වර්ෂය සඳහා ආදායම් බදු ගණනය කිරීම් සටහන්	36 – 37
16	2018 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම්	38 – 39

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

2018 වර්ෂය සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

1.0 පසුබිම

1950 වර්ෂයේදී කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලද කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව 1955 අංක 19 දරණ රාජ්‍ය අනුග්‍රහයලත් සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1956 වර්ෂයේ රාජ්‍ය සංස්ථාවක් බවට පරිවර්තනය කරන ලදුව කන්කසන්තුරේ සිමෙන්ති කම්හල නමින් ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.

ඉන්පසුව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1959 ජනවාරි 01දා සිට ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය නමින් නැවත ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.

1980 වර්ෂයේදී අතිවිශේෂ ගැසට්පත්‍රයේ නිවේදනයට අනුව මෙහි නම ‘‘ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව’’ ලෙස සංශෝධනය කරන ලදි.

කර්මාන්ත හා විද්‍යාත්මක කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ අප සංස්ථාව 1985 පෙබරවාරි 01වන දින සිට පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය වෙත පවරා ගන්නා ලදි. ඉන් පසු 1997 ජුනි 19 වන දින සිට 2010 අප්‍රේල් මාසය දක්වා කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වී ඉන් අනතුරුව රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා 2015 පෙබරවාරි මාසය දක්වා එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය. වර්තමානය වන විට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, කර්මාන්ත හා වාණිජ කටයුතු ,දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම ,සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

2.0 දැක්ම හා මෙහෙවර ප්‍රකාශය

දැක්ම

‘‘ශ්‍රී ලංකාවේ සිමෙන්ති කර්මාන්තයේ සංවර්ධනය සඳහා වන පහසුකම් සැපයීම සහ එහි පුරෝගාමියා වශයෙන් මගපෙන්වීම් කිරීම’’

මෙහෙවර

‘‘ගුණාත්මකභවින් යුතු සිමෙන්ති සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන රටේ පවතින අවශ්‍යතාවයට සරිලන පරිදි සැපයීම’’

ප්‍රධාන ක්‍රියාකාරකම්

1959 ජනවාරි 02 දිනැති අංක 11634 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් සංස්ථාවේ කාර්යන් හා පරමාර්ථ ලෙස පහත දැ ප්‍රකාශයට පත් කර ඇත.

- සිමෙන්ති නිෂ්පාදනය හා විකිණීම
- සිමෙන්තියෙන් හෝ කොන්ක්‍රීට් වලින් නිෂ්පාදනය කරනු ලබන දුරකථන සහ විදුලි පණිවුඩ හුවමාරු කණු, දුරකථන කුටි, ජලය ගෙන යන උපකරණ, හියුම් නල සහ ටයිල් නිෂ්පාදනය ආදීය නිපදවීම හා අලෙවි කිරීම
- ඕනෑම පුද්ගලයෙකුට විදුලි බලය තොග වශයෙන් සැපයීම
- එසේම, 1964 මැයි 11 දිනැති අංක 14033 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් 1959 ජනවාරි 02 දිනැති අංක 11634 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද ‘‘සිමෙන්ති නිෂ්පාදනය හා බෙදාහැරීම’’ වෙනුවට ‘‘ සිමෙන්ති නිෂ්පාදනය, ආනයනය කිරීම හා විකිණීම’’ ලෙස ඇතුලත් කරන ලද.

ප්‍රධාන පරමාර්ථ

සංස්ථාවේ ප්‍රධාන පරමාර්ථය වනුයේ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව නැවත ආරම්භ කිරීම වේ. එසේම, සංස්ථාව සතු කොල්ලුපිටියේ , මන්නාරම, පාලාවි සහ අරුවක්කාළු හි පිහිටා ඇති ඉඩම් සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ආදායම් ඉපැයුම් මාර්ග බවට එම වත්කම් පරිවර්ථනය කර ගැනීමද සංස්ථාවේ අරමුණු අතර වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වල රු.1,083,618,910/-ක් 1981දී ආයෝජනය කරන ලද අතර එහි කොටස් ප්‍රාග්ධනයෙන් 62.45%ක හිමිකාරීත්වය දරනු ලැබේ. කොටසක සම මිල රු.10/-ක් වේ. 2015 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී එහි කොටසක වෙළඳ පොළ අගය රු.8.20ක් වූ අතර දෙසැම්බර් මාසයේදී එහි අගය රු.7.90ක් විය. මෙම ආයෝජනයට අදාල ප්‍රතිලාභ මෙතෙක් සංස්ථාවට ලැබී නොමැත. 2016 පෙබරවාරි 25 සිට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව හා ලංකා සිමෙන්ති සමාගම අධ්‍යක්ෂ මණ්ඩල දෙකක් යටතේ වෙන වෙනම ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, සීමාසහිත ලෆාර්ජ් මහවැලි මෙරින් සිමෙන්ති සමාගමේ කොටසක අගය රු. 10/-ක් වූ කොටස් 320,000ක ආයොජනයක් සිදු කර ඇති අතර 1995 දෙසැම්බර් 31 දින එම කොටස් දෙකකට එකක් ලෙස වූ ප්‍රසාද කොටස් නිකුතුවෙන් පසු එම සමාගමේ මුළු කොටස් හිමිකාරීත්වය 480,000ක් විය. එය මුළු කොටස් හිමිකාරීත්වයෙන් 10%ක් වේ.මෙම ආයොජනයට අදාලව 1999දක්වා ප්‍රතිලාභ සංස්ථාවට හිමිවුනි. නැවත 2014 වර්ෂයට අදාලව රු.1,728,000/-ක් ලාභාංශ වශයෙන් 2015 වර්ෂයේදී හිමි විය.

3.0 වර්තමාන තත්වය

සංස්ථාව සතුව තිබූ පුත්තලම සිමෙන්ති කර්මාන්තශාලාව හා රුහුණු සිමෙන්ති කර්මාන්තශාලාව ජනතාකරණයට භාජනය වීමත්, මට්ටක්කුලියේ පිහිටා තිබූ කඩදාසි මළු ඒකකයේ අයිතිය මහාභාණ්ඩාගාරයට මාරු කිරීම නිසාත්, දැනට සංස්ථාව සතු වනුයේ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව පමණි. එම කර්මාන්තශාලාවද උතුරේ පැවති යුධමය වාතාවරණය හේතුවෙන් 1990 ජුනි මස සිට වසා දමා ඇති අතර එම භූමිය මේ වන විටත් ශ්‍රී ලංකා යුධ හමුදාව යටතේ පවතී.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු කන්කසන්තුරේ පිහිටි ඉඩම් නිදහස් කරගැනීමටත් නැවත එහි සිමෙන්ති නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමටත් කිහිපවිටකදීම උත්සාහ කලද එය නිෂ්පල විය. එසේම, ආරක්ෂක අංශයන්ගේන් මෙම ඉඩම් නිදහස් කරගැනීමෙන් අනතුරුව නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය පසුබිම ඇතුලත් වාර්තා සකස් කර ආදාළ පාර්ශව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

සිමෙන්ති නිෂ්පාදන කටයුතු නවතා දමා ඇති බැවින් සංස්ථාව විසින් 2008 වර්ෂයේ සිට සාමාන්‍ය පොට්ලන්ඩ් සිමෙන්ති ආනයනය කර බෙදාහැරීමේ ක්‍රියාවලියේ නිරත වූ අතර 1997 වර්ෂයේ සිට කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනයන් සිදු කිරීම හා අලෙවිකිරීමේ නිරත විය.

2016 වර්ෂයේදීද මහා භාණ්ඩාගාරය විසින් හදුන්වාදෙනු ලැබූ ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය යටතේ සේවකයින් 36 දෙනෙකු 2016.07.31 දිනට විශ්‍රාම යන ලදි.

(අ) සිමෙන්ති ආනයනය හා අලෙවිය :

අවම මිලකට ඉහළ ගුණත්වයෙන් යුතු සිමෙන්ති අවසන් පාරිභොගිකයා වෙත සැපයීම සඳහා 2008 වර්ෂයේ සිට සිමෙන්ති ආනයනය කර **"කන්කේසන්"** වෙළඳ නාමය යටතේ අලෙවි කිරීම සිදු කරන ලදි.
2008 වර්ෂයේ සිට 2012 සංස්ථාව විසින් සිමෙන්ති මෙට්‍රික් ටොන් 219,559ක් ආනයනය කර ඇත.

2017 වර්ෂයේදී සිමෙන්ති මෙට්ට්‍රික් ටොන් 980ක් පමණක් ආනයනය කර අතර සිමෙන්ති අලෙවි කිරීම සඳහා පළපුරුදු සේවකයින් නොමැති වීම සහ මුල්‍යමය අපහසුතා මත සිමෙන්ති ආනයනය කර විකිණීම් කටයුතු තාවකාලිකව නවතා ඇත.

සිමෙන්ති අලෙවිය

වර්ෂය	2018	2017	2016	2015
ප්‍රමාණය (මෙට්ට්‍රික් ටොන්)	-	980	4,002	2,780
වටිනාකම (රු.මිලියන)	-	12.66	60.15	37.87

(ආ) **කොන්ක්‍රීට් ආශ්‍රීත නිෂ්පාදනයන් සිදු කිරීම හා අලෙවිකිරීම :**

කොන්ක්‍රීට් ආශ්‍රීත නිෂ්පාදනයන් සිදු කිරීම 1997 ඔක්තෝබර් මාසයේදී සංස්ථාව විසින් උරුම්පිරායි ප්‍රදේශයේ ආරම්භ කර ඇත. මෙමගින් ප්‍රධාන වශයෙන් ලංකා විදුලි බල මණ්ඩලය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් යන ආයතන වලට කොන්ක්‍රීට් රැහැන් ආධාරක කණු නිෂ්පාදනයෙහි නිරත වී ඇත.

2009 වර්ෂයේදී කොන්ක්‍රීට් රැහැන් ආධාරක කණු නිෂ්පාදනයට අමතරව කොන්ක්‍රීට් ගල්, තලාංද පදිකා වේදිකා ඇතුරුම්, කම්බි කණු යනාදි නිෂ්පාදන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, යාපනය විශ්වවිද්‍යාලය සහ සාමාන්‍ය ජනතාව වෙත අලෙවි කිරීම ආරම්භ කරන ලදි.

2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කොන්ක්‍රීට් ආශ්‍රීත නිෂ්පාදන 16,431ක් සිදු කර ඇත.

එසේම 2013 හා 2014 යන වර්ෂ වලදී පිළිවෙලින් කොන්ක්‍රීට් ආශ්‍රීත නිෂ්පාදන 2,003ක්, 1,674 ක් සිදු කර ඇත. 2015 වර්ෂයේදී කොන්ක්‍රීට් කණු 191ක්, පන්තල් කණු 832ක් හා කොන්ක්‍රීට් ගල් 71,771ක් නිෂ්පාදනය කර ඇත. එසේම, 2016 වර්ෂයේදී කොන්ක්‍රීට් කණු 168ක්, වැටවල් සඳහා වූ කණු 224ක්, ආර්.සී.කණු 95ක් හා කොන්ක්‍රීට් ගල් 30,122ක් නිෂ්පාදනය කර ඇත.

කොන්ක්‍රීට් ආශ්‍රීත නිෂ්පාදන අලෙවිය

වර්ෂය	2018	2017	2016	2015
කොන්ක්‍රීට් කණු	-	-	304	-
වැටවල් සඳහා වූ කණු	-	4	253	391
ආර්.සී.කණු	99	145	169	419
කොන්ක්‍රීට් ගල්	-	-	46,907	54,805
වටිනාකම (රු.මිලියන)	**0.56**	**1.13**	**4.07**	**2.69**

චක්‍ර ලේඛ අංක 02/2016ට අනුව ක්‍රියාත්මක වූ ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය යටතේ කොන්ක්‍රීට් ආශීත නිෂ්පාදන අංගනයේ සේවයේ නියුතුව සිටි සේවකයින් 02 දෙදෙනෙකු හැර අනෙකුත් සේවකයින් 2016.07.31දින සිට විශ්‍රාම යන ලදි.

(ඇ) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු වත්කම්වලින් උපයන ලද කුලී ආදායම්

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් හුණුගල් අවශ්‍ය පුද්ගලයන් සොයා එම ඉඩම් කල්බදු පදනම මත ලබා දී හා එළඹී තිබෙන ගිවිසුම් යාවත්කාලීන කර ඉන් ආදායම් ඉපයා ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලදි.

(ඈ) ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීම පිළිබඳ මධ්‍යකාලීන ක්‍රියාමාර්ග :

සංස්ථාව සතු කොල්ලුපිටියේ , මන්නාරම, පාලාවි සහ අරුවක්කාළු හි පිහිටා ඇති ඉඩම් සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ආදායම් ඉපැයුම් මාර්ග බවට එම වත්කම් පරිවර්ථනය කර ගැනීමට සංස්ථාව බලාපොරොත්තු වේ. ඒ තුලින් සංස්ථාව ස්ථායී හා කාර්‍යක්ෂම මට්ටමකට ගෙන ඒමට බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව හා එහි පරිපාලිත සමාගම වන ලංකා සිමෙන්ති සමාගම ප්‍රතිව්‍යුහගත කල යුතු ආයතන ලෙස හඳුනාගෙන ඊට අදාළ කටයුතු සිදු වෙමින් පවති. එසේම, අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ලංකා සිමෙන්ති සමාගම සමග ඒකාබද්ධ කිරීමට කටයුතු සිදු වේ. 2016 වර්ෂයේ පෙබරවාරි මස සිට මෙම ආයතන දෙක වෙන වෙනම වූ අධ්‍යක්ෂ මණ්ඩල යටතේ කළමණාකරණය වේ.

4.0 ලාභදායීත්වය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව , 2011 වර්ෂයේදී රු.මිලියන 2.6ක ලාභයක් උපයා ඇත. 2012, 2013 හා 2014 වර්ෂ වලදී පිළිවෙළින් රු. මිලියන 75ක්, රු. මිලියන 424ක් හා රු. මිලියන 13ක් ලෙස අලාභ දරා ඇත. නැවත ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව 2015 හා 2016 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.මිලියන 4.34ක හා රු.මිලියන 31.70ක ප්‍රකාශිත ගණකාධිකරණ ලාභ උපයාගෙන ඇත. 2017 වර්ෂයේදී සංස්ථාව රු.මිලියන12.70ක ලාභයක් වාර්තා කර ඇත.

2018 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව රු.මිලියන19.59 ක බදු පෙර ලාභයක් උපයා ඇත. එය පෙර වසර හා සැසඳීමේදී 7.78% වර්ධනයක් පෙන්නුම් කරනු ලැබේ. සිමෙන්ති ආනයනය කර බෙදාහැරීම නවතා දැමීම මීට සෘජුව බලපා ඇත. මෙම වර්ෂය තුල මාස 08කට අදාල බැංකු ණය පොලී කපාහැරීමක් ලබාගත් අතර එහි වටිනාකම රු.මිලියන10.07කි. මෙම වසරේ සංස්ථාවේ බදු පසු ලාභය රු. මිලියන 15.96කි.

5.0 ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ අනාගත කාර්යභාරය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව පවතින එකම සිමෙන්ති නිෂ්පාදන කර්මාන්තශාලාව කන්කසන්තුරේ කර්මාන්තශාලාව වන අතර යුධමය වාතාවරණය හේතුවෙන් එය 1990 ජුනි මස වසාදැමීමෙන් පසු මේ වන තුරු සිමෙන්ති නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොමැත. එසේම එහි නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීම පිළිබඳ පුරෝකථනයන්ද සිදුකල නොහැක. නමුත්, නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීමට අදාල වාර්තා සකස් කර අදාල ආයතන වෙත භාර දී ඇත.

මෙම කන්කසන්තුරේ කර්මාන්තශාලාව සහිත භූමිය නැවත සිමෙන්ති සංස්ථාවට භාරදෙන ලෙස ඉල්ලීම් කර තිබුනද වර්තමානය වන විටත් එය භාර දීමට ශ්‍රී ලංකා යුධ හමුදාව කටයුතු කර නොමැත. මෙම භූමිය සංස්ථාවට මුදා හැරීමෙන් අනතුරුව ඊට යෝග්‍ය සංවර්ධන කටයුත්තක් ආරම්භ කල හැකිවේ.

කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු අමාත්‍යාංශයේදී 2016.10.20වන දින පැවති "2016.07.31 දින ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වූ ආයතන වල ඉදිරි කටයුතු පිළිබඳ" රැස්වීමේදී ගනු ලැබූ තීරණ 2016.10.27 දිනැති අංක MIN/R/07/06/07 දරණ ලිපිය මඟින් දැනුවත් කල අතර ඒ අනුව අප සංස්ථාව සතු කොල්ලුපිටිය,මන්නාරම, පුත්තලම හා කන්කසන්තුරේ පිහිටා ඇති ඉඩම් සඳහා යෝග්‍ය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

සුදුසු සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සාකච්ඡා සිදුවෙමින් පවතී.

එම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් ජනිත වන ආදායම් මනා ලෙස කළමණාකරණය කිරීමටත්, ඒ තුලින් සංස්ථාවේ මූල්‍ය තත්වය ශක්තිමත් මට්ටමකට ගෙන ඒමට හා සංස්ථාව ස්ථාවර මට්ටමකට ගෙන ඒමටත් උත්සාහ කරනු ලැබේ.

6.0 සේවය ඇගයීම

2018 වර්ෂයේදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ කටයුතු සඳහා ලබාදුන් මගපෙන්වීම් සම්බන්ධව කර්මාන්ත හා වාණිජ කටයුතු ,දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම ,සමුපකාර සංවර්ධන සහ ව්‍යත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා හට අධ්‍යක්ෂ මණ්ඩලයේ ගෞරවනීය ස්තූතිය පුද කර සිටින අතර සංස්ථාවට ලබාදුන් සහයෝගය වෙනුවෙන් රේඛිය අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ, රාජ්‍ය බැංකුවල හා අනෙකුත් රජයේ ආයතන වල සේවයේ නියුතු සියලු නිලධාරීන්ට අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය පුද කර සිටිමු.

එසේම, ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සේවයේ නියුතු සේවකයින්හටද අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය පුද කර සිටිමු.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව පිළිබඳ තොරතුරු

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ප්‍රධාන කාර්යාලය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, නො.27, වොක්ෂෝල් මන්දිරය, වොක්ෂෝල් පාර, කොළඹ 02.

දුරකථන අංක : 0112 440 201 , 0112 440 203 හා 0112 440 205
ෆැක්ස් අංක : 0112 448 866

සිමෙන්ති කර්මාන්තශාලාව

කන්කේසන් සිමෙන්ති කර්මාන්තශාලාව, කන්කසන්තුරේ.

කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන අංගනය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, උරුමිපිරායි, යාපනය.
දුරකථන අංක : 0213 215 340

බැංකුකරුවෝ

ලංකා බැංකුව, මහජන බැංකුව

විගණකවරු

විගණකාධිපති දෙපාර්තමේන්තුව, අංක.306/72, පොල්දුව පාර, බත්තරමුල්ල.

පරිපාලිත සමාගම - ලංකා සිමෙන්ති සමාගම

ප්‍රධාන කාර්යාලය

ලංකා සිමෙන්ති සමාගම, නො.27, වොක්ෂෝල් මන්දිරය, වොක්ෂෝල් පාර, කොළඹ 02.

දුරකථන අංක : 0112 447 746, 0112 399 243
ෆැක්ස් අංක : 0112 447 541

සිමෙන්ති කර්මාන්තශාලාව

සිමෙන්ති කර්මාන්තශාලාව, කිරීමලේ පාර, කන්කසන්තුරේ.

සිමෙන්ති ගබඩාව

නො.472, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 02.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

2018 වර්ෂයේ පහත දැක්වෙන අධ්‍යක්ෂවරුන් කළමණාකරණ මණ්ඩලයේ කටයුතු කර ඇත.

01. හුසේන් අහමඩ් බහිලා මහතා	සභාපති	2015.12.10	සිට	2018.06.25
02. එම්.රියාස් සාලී මහතා	සභාපති	2018.06.25	සිට	2019.04.10
03. එස්. සුබයිර්ඩීන් මහතා	සභාපති	2019.04.10		
04. එස්. අබීඩීන් එහියා මහතා	කළමණාකරණ අධ්‍යක්ෂ	2016.02.16	සිට	
05. ඩබ්.ඩී.ජානක මහතා	අධ්‍යක්ෂ	2015.02.25	සිට	2018.07.24
06. එම්.එස්.එම්.කබීර් මහතා	අධ්‍යක්ෂ	2015.03.18	සිට	
07. එන්.එම්.මුනාවර් මහතා	අධ්‍යක්ෂ	2015.03.31	සිට	
08. ඒ.රෂීක් මහතා	අධ්‍යක්ෂ	2015.04.30	සිට	
09. ඩී.එස්.කොස්තා මහත්මිය	මහාභාණ්ඩාගාර නියෝජිත	2015.10.30	සිට	
10. කේ.එන්.ෆොනැන්ඩෝ මහත්මිය	අමාත්‍යාංශ නිරීක්ෂක	2017.12.26	සිට	2018.07.25
11. එල්.ජී.නිලංග ඩී. සෝමපාල	අමාත්‍යාංශ නිරීක්ෂක	2018.07.25	සිට	2019.04.26
12. ඩබ්.එන්.ආර්.විජේකෝන්	අමාත්‍යාංශ නිරීක්ෂක	2019.04.26	සිට	

ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කමිටුව

01. එම්.ජී.ඒ.ටී.ආර්.ජයතිලක	ගණකාධිකාරී
02. ඊ.එස්.චාන්දනී	පිරිස් නිලධාරී

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

2018.12.31 දිනට මානව සම්පත් පිරිස් බලය

වර්ගය	ජ්‍යෙෂ්ඨ කළමණාකරන	මධ්‍ය කළමණාකරන	කණිෂ්ඨ කළමණාකරන	කළමණාකරන සහකාර	ප්‍රථමික මට්ටම	එකතුව
ප්‍රධාන කාර්‍යාල ය	02	01	01	03	07	14
කොන්ක්‍රීට් අංගනය	-	-	-	-	01	01
එකතුව	**02**	**01**	**01**	**03**	**08**	**15**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ආයතනයේ කාර්ය සාධනය පිළිබඳ සභාපතිගේ වාර්තාව

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2018 දෙසැම්බර් මස 31දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික වාර්තාව සහ මුල්‍ය ප්‍රකාශන එහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මා ඉතා සතුටින් ඉදිරිපත් කර සිටිමු.

මෙම වර්ෂය තුලදී, සංස්ථාව සතු උපයෝජනය නොකල වත්කම් සඳහා මහාපරිමාණ යටිතල පහසුකම් දියුණුකිරීම සම්බන්ධව වන රජයේ ප්‍රතිපත්ති මත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඉන් ආදායම් උපයාගැනීම සම්බන්ධ හැකියාව සලකා බලන ලදි.

වර්ෂයට අදාළව සංස්ථාව විසින් රු.මිලියන 36ක් ආදායම් ලෙස උපයන ලද අතර පෙර වර්ෂයේ උපයන ලද ආදායම හා සසඳා බලන කල එහි රු.මිලියන 13ක අඩුවීමක් පෙන්නුම් කරනු ලැබේ. මෙම ආදායම් අඩුවීමට කි.ලෝ 50 සාමාන්‍ය පොට්ලන්ඩ් සිමෙන්ති බෑග් ආනයනය කර බෙදාහැරීම නවතා දැමීම මුලික වශයෙන් බලපා ඇත.

කෙසේ නමුත්, මෙම වර්ෂයේ පරිපාලන හා මුල්‍ය වියදම්වල අඩුවීම හේතුවෙන් පෙර වර්ෂය හා සසඳා බැලීමේදී මෙම වර්ෂයට අදාල බදු පෙර ලාභයේ රු.මිලියන 1.42ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

අවසාන වශයෙන් මෙම වර්ෂය තුලදී මුල්‍යමය මෙහෙයුම් කටයුතු සම්බන්ධව අප ස්ථායී වී තිබෙන අතර ඉදිරියේදී තවත් අදියරක් සාක්ෂාත් කරගැනීමට බලාපොරොත්තු වේ.

කර්මාන්ත හා වාණිජ කටයුතු ,දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම ,සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාහට මාගේ ගෞරවනීය ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කරන ගනු ලබන අතර අමාත්‍යාංශ ලේකම්තුමා සහ එහි කාර්යමණ්ඩලය මෙම මුල්‍ය වර්ෂය තුල ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ කටයුතු සඳහා ලබාදුන් සහයෝගය හා මගපෙන්වීම සම්බන්ධවද මාගේ ස්තූතිය පුද කර සිටිමු.
එසේම, අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් වෙත සහ ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සේවයේ නියුතු සේවකයින්හටද මාගේ ස්තූතිය පුද කර සිටිමු.

අන්සන් කලේ,
එම්.රියාස් එස්.සාලී
සභාපති,
ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ

මූල්‍ය තත්ව ප්‍රකාශනය
2014 සිට 2018 දක්වා වූ වර්ෂයන්හි දෙසැම්බර් 31 දිනට

			පුනප්‍රකාශිත		
	2018	**2017**	**2016**	**2015**	**2014**
වත්කම්	**රු.'000**	**රු.'000**	**රු.'000**	**රු.'000**	**රු.'000**
ජංගම නොවන වත්කම්					
දේපල පරියත හා උපකරණ	1,457	1,590	3,887	4,173	779,317
ආයෝජන වත්කම්	796,950	796,950	773,700	773,700	-
දිර්ඝකාලීනව ලැබිය යුතු දෑ	-	-	-	757,224	757,224
ආයෝජනයන්	624,063	624,063	624,063	862,458	721,589
මූල්‍ය වත්කම්	6,163	5,689	5,162	35,469	33,428
	1,428,633	**1,428,292**	**1,406,812**	**2,433,024**	**2,291,558**
ජංගම වත්කම්					
තොගය	925	1,241	3,099	8,594	18,933
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	72,999	74,469	89,212	80,551	96,247
ඉදිරියට කල ගෙවීම්	-	-	-	-	-
මුදල් හා මුදල් සමාන දෑ	19,868	9,158	13,687	8,743	2,076
	93,793	**84,868**	**105,998**	**97,838**	**117,256**
මුළු වත්කම්	**1,522,426**	**1,513,160**	**1,512,810**	**2,530,863**	**2,408,814**
හිමිකම් හා වගකීම්					
හිමිකම්					
කොටස් ප්‍රාග්ධනය	966,971	966,971	966,971	966,971	966,971
පොදු සංචිතය	9,997	9,997	9,997	9,997	9,997
ප්‍රත්‍යාගණිත සංචිත	561,203	561,203	536,119	536,119	713,619
රදවාගත් ඉපැයුම්	(181,898)	(197,585)	(210,289)	515,234	333,315
විකිණිම සඳහා වන දැහි සංචිත	(465,956)	(465,956)	(465,956)	(227,560)	(368,430)
	890,317	**874,630**	**836,842**	**1,800,761**	**1,655,474**
ජංගම නොවන වගකීම්					
දිගුකාලීන වගකීම්	586,126	492,426	492,426	500,426	519,303
විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම්	4,013	3,796	3,298	18,697	19,394
	590,139	**496,222**	**495,724**	**519,123**	**538,698**
ජංගම වගකීම්					
වෙළඳ හා ගෙවිය යුතු දෑ	36,824	42,317	46,502	81,305	93,227
පොළී ගෙවිය යුතු ජංගම වගකීම්	4,000	97,794	97,793	101,020	68,515
උපචිත බැංකු ණය පොළී	1,146	2,198	21,768		
මුදල් හා මුදල් සමාන දෑ	-	-	14,181	28,653	52,900
	41,970	**142,308**	**180,244**	**210,978**	**214,642**
මුළු හිමිකම් එා වගකීම්	**1,522,426**	**1,513,160**	**1,512,810**	**2,530,863**	**2,408,814**

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

විස්තීරණ ආදායම් හා රදවාගත් ඉපැයුම් ප්‍රකාශනය

2014 සිට 2018 දක්වා දෙසැම්බර් 31 න් අවසන් වර්ෂ සඳහා

			පුනප්‍රකාශිත		
	2018	**2017**	**2016**	**2015**	**2014**
	රු.'000	**රු.'000**	**රු.'000**	**රු.'000**	**රු.'000**
ආදායම්	36,064	49,468	64,221	40,571	285,657
විකුණුම් පිරිවැය	(316)	(16,215)	(66,525)	(50,781)	(280,878)
දළ ලාභය/(අලාභය)	**35,748**	**33,254**	**(2,304)**	**(10,211)**	**4,779**
වෙනත් ආදායම්	15,375	22,217	91,542	60,043	34,233
බෙදාහැරීම් වියදම්	-	(272)	(292)	(1,198)	(2,951)
පරිපාලන වියදම්	(16,883)	(20,524)	(41,172)	(30,461)	(29,211)
මුල්‍ය වියදම්	(14,652)	(16,501)	(15,704)	(15,334)	(20,642)
බදු පෙර ලාභය/(අලාභය)	**19,589**	**18,174**	**32,070**	**2,839**	**(13,793)**
බදු පිරිවැය	(3,630)	(2,877)	(369)	(255)	-
වෙනත් විස්තීරණ ආදායම්/(වියදම්)	-	586	(995,620)	140,870	43,345
පෙර වර්ෂ ගැලපීම්	(271)	(3,180)	-	-	-
බදු පසු ලාභය	**15,687**	**12,703**	**(963,181)**	**143,454**	**(29,552)**

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

විගණන කමිටුවේ වාර්තාව - 2018

සංස්ථාවේ විගණන කමිටුවේ විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විතවේ. කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකතුමා හා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතවරයෙකුද නිරීක්ෂකවරුන් ලෙස ඊට සහභාගි වේ.

විගණන කමිටුවේ සභාපති ලෙස ඩී.එස්.කොස්තා මහත්මිය කටයුතු කරනු ලබයි. එම්.එස්.එම්.කබීර් මහතා සහ එන්.එම් මුනාවර් මහතා කමිටුවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කරනු ලැබේ.

විගණන කමිටුවේ වගකීම් හා කාර්යභාරය පහත පරිදි වේ.
අ. වාර්ෂික වාර්තාවන්, ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට හා අනෙකුත් අදාල නීතිමය තත්වයන්ට අනුකූල වන ලෙස සකස්කර තිබේද යන්න පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් ලබා දීම.

ආ. අදාල නීති, රෙගුලාසි සහ අනුමත චක්‍රලේඛයන්ට අනුකූලව සංස්ථාව කටයුතු කර තිබේද සහ එසේ අනුකූල නොවන අවස්ථාවන් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් ලබා දී දැනුවත් කිරීම.

ඇ. අභ්‍යන්තර සහ බාහිර විගණන වාර්තා සහ පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරකසභාවේ උපදෙස් සලකා බැලීම හා ඒ පිළිබඳ කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට උපකරෙ කිරීම.

ඈ. අභ්‍යන්තර පාලන ක්‍රමයන් සංස්ථාවට හඳුන්වා දීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ විගණන කමිටුව විසින් වෙන්ත් කාර්යයන් සමග පහත සඳහන් ක්‍රියාකාරකම් වලද යෙදුනි.

- විගණනය නොවූ මාසික මූල්‍ය වාර්තා පරික්ෂා කිරීම.
- විගණනය වූ වර්ෂයට අදාල මූල්‍ය වාර්තා පරික්ෂා කිරීම.
- විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණක වාර්තා පරික්ෂා කිරීම හා කළමණාකරණය විසින් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම.
- ව්‍යවස්ථාපිත ගෙවීම් පිළිබඳ දැනුවත් කිරීම.

අත්සන් කලේ,

ඩී.එස්.කොස්තා,
සභාපති
විගණන කමිටුව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීසීඑම්/ඒ/එස්එල්සීසී/69/2018/එ

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2019 මැයි 29 දින

සභාපති
ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. මතය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 1960 ජූලි 08 දිනැති අංක 12156 දරන ගැසට් නිවේදනය සහ අංක A 2099 දරන සැලැස්ම අනුව කන්කසන්තුරේ පිහිටි අක්කර 241.56 ක් සංස්ථාව වෙත 1960 ජූලි 08 දින පවරා දී තිබුණි. එම පවරා දීමට අදාළ සැලැස්මට අනුව සංස්ථාව සතුව තෙල්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ටැංකි 02 ක්ද පවතින බව නිරීක්ෂණය වූ අතර, මෙම ඉඩම සහ තෙල් ටැංකි තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1977 සැප්තැම්බර් 20 දිනැති අංක 283/2 දරන ගැසට් නිවේදනය මගින් සංස්ථාවට පවරාදී තිබූ අක්කර 5423 රූඩ් 2 පර්චර්ස් 36 ක් වූ පුත්තලම අරුවක්කාලු හුණුගල් නිධිය මූල්‍ය ප්‍රකාශනවල අක්කර 5352 ක් ලෙස සටහන් කර තිබුණි. වසර 50 ක කාලයක් සඳහා හොල්සිම් (ලංකා) සමාගම වෙත (වර්තමානය වන විට සියාම් සිටි සිමෙන්ති (ලංකා) සමාගම) බදු දී තිබූ මෙම ඉඩම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් යටතේ ගිණුම්ගත කළ යුතු පුත්තලම පාලවී හී පිහිටි අට්ටවිල්ලු නැමති ඉඩමේ කැබලි අංක 09, 12 සහ 14 දරන කැබලි වල එකතු භූමි ප්‍රමාණය අක්කර 170 රූඩ් 02 පර්චර්ස් 28 ක් රු.61,200,000 කට තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර තිබූ අතර, මෙම ඉඩම මූල්‍ය ප්‍රකාශනවල අයෝජන දේපළ ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ හා වාර්තාකරණ ප්‍රමිත

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 07

ආයෝජන දේපළ වලින් ලද එකතුව රු.4,376,820 ක ආයෝජන ආදායම ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයක් ලෙස සටහන් නොකර, මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයක් ලෙස සටහන් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 40

ප්‍රමිතයේ වගන්ති අංක 33 අනුව ආයෝජන දේපළ අගය කිරීම සඳහා සංස්ථාව සාධාරණ අගය (Fair Value Method) ක්‍රමය තෝරාගෙන තිබුණි. නමුත්, 2018 දෙසැම්බර් 31 දිනට සාධාරණ අගය පදනම් කරගෙන ආයෝජන දේපළ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා වාර්තාකරණ ප්‍රමිත (SLFRS) 05

ප්‍රමිතයේ 38 සහ 41 වන වගන්ති ප්‍රකාරව විකිණීම සඳහා ඇති සහ මෙහෙයුම් නවතා දමන ලද රු.750,000 කට තක්සේරු කරන ලද ජංගම නොවන වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ආයෝජන දේපළ ලෙස සටහන් කර තිබුණි.

1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ගිණුම් විෂයය	රු.	ඉදිරිපත් නොවූ සාක්ෂි
(අ) වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ	72,999,219	ශේෂ සනාථ කිරීම් ලිපි
(ආ) වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ	36,823,993	ශේෂ සනාථ කිරීම් ලිපි

1.2.4 නොසැසඳූ පාලන ගිණුම්

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම් ගිණුම් 03 ක එකතු වටිනාකම රු.9,427,096 ක් වුවද, ස්ථාවර වත්කම් ලේඛන අනුව එම වත්කම් වල එකතු වටිනාකම රු.5,827,487 ක් වූයෙන් රු.3,599,609 ක වෙනසක් පැවතුණි.

1.2.5 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

සංස්ථාව විසින් 1981 වර්ෂයේදී ලංකා සිමෙන්ති සමාගමේ රු.10 කොටස් 108,361,891 ක, රු.1,083,618,910 ක් ආයෝජනය කර තිබුණි. ඒ අනුව සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන සී/ස ලංකා සිමෙන්ති සමාගමේ කොටස් හිමිකමෙන් සියයට 62.45 ක් සංස්ථාව සතු වුවද, සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් නිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති/ විධානයට යොමුව	**විස්තරය**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 135	මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් ලිඛිතව පවරා දී නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 757(4)	මුදල් වර්ෂය අවසන් වූ වහාම ආයතනය සතු වත්කම් පිළිබඳව සමීක්ෂණයක් පවත්වා එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
(අ) 1959 ජනවාරි 02 දිනැති අංක 11,634 දරන අති විශේෂ ගැසට් නිවේදනය.	(i) සිමෙන්ති නිෂ්පාදනය කර අලෙවි කිරීම සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන, සංස්ථාවේ ප්‍රධාන අරමුණු වුවත්, පසුගිය යුධමය වාතාවරණයෙන් පසුව කන්කසන්තුරේ කම්හලෙහි සිමෙන්ති නිෂ්පාදනය නතර කර තිබුණි. ඒ අනුව පසුගිය කාලය තුළ සිමෙන්ති බෑග් ආනයනය කර අලෙවිය සිදු කර තිබූ අතර, 2018 සැප්තැම්බර් 30 දිනෙන් පසුව සිමෙන්ති බෑග් ආනයනය කර අලෙවියද නතර කර තිබුණි. (ii) සංස්ථාව 2018 වර්ෂයේදී සිමෙන්ති කණු නිෂ්පාදනය කර අලෙවි කිරීම මගින් රු.2,480,000 ක අලෙවි ආදායමක් අපේක්ෂා කළද, වර්ෂය තුළ තත්‍ය අලෙවි ආදායම රු.579,569 ක් විය. ඒ අනුව සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන අලෙවියේ ප්‍රගතිය සියයට 23.4 ක් වූ අතර, 2018 වර්ෂය අවසානය වන විට කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනය ද සම්පූර්ණයෙන්ම නතර කර තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර හාවිතා කර නොමැති බව.

(අ) සිමෙන්ති සංස්ථාව 2018 ජූලි 06 දින අංක 316 දරන ගෙවීම් වවුචරය භාවිතා කර සී/ස ලංකා සිමෙන්ති සමාගම වෙත රු.1,000,000 ක් ගෙවීම් කර තිබුණි. 2018 වර්ෂයේ සංස්ථාවේ අයවැය මඟින් ප්‍රතිපාදනය කර නොතිබූ මෙම මුදල් සමාගම සමඟ කිසිදු ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව සමාගමේ පරිපාලන වියදම් පියවා ගැනීමට ගෙවීම් කර තිබූ අතර, සමාගම ව්‍යාපාරික කටයුතු නතර කර තිබීම නිසා මෙම මුදල් 2019 මාර්තු මස වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව, තාක්ෂණික අධ්‍යයනයක් සිදු කිරීම සඳහා සංස්ථාවට අයත් අරුවක්කාලු ඉඩම, පෞද්ගලික සමාගමකට ලබාදී තිබුණි. මෙම තාක්ෂණික අධ්‍යයනය පිළිබඳව සංස්ථාව සහ පෞද්ගලික සමාගම අතර, ලිඛිත ගිවිසුමකට එළඹී නොතිබූ අතර, 2018 වර්ෂය සඳහා ඇමරිකානු ඩොලර් 20,000 ක් එනම්, රු.3,596,580 ක වටිනාකමක් සංස්ථාවට ලැබී තිබුණි.

(ඇ) සංස්ථාව සතු කන්කසන්තුරේ පිහිටි තෙල් ටැංකි 02 ක් ලිඛිත ගිවිසුමකට එළඹීමෙන් තොරව 2010 වර්ෂයේ සිට රාජ්‍ය සමාගමකට ගාස්තු අයකර ගැනීමකින් තොරව පරිහරණය සඳහා ලබාදී තිබුණි. මෙම තෙල් ටැංකි ලිඛිත ගිවිසුමකට අනුව ලබාදීමට සහ ඒ සඳහා ගාස්තු අයකර ගැනීමට සංස්ථාවේ කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ ජර්නල් සටහන් 02 ක් භාවිතා කර එකතුව රු.10,065,512 ක් ණය පොළී ගිණුම හර කර ගෙවිය යුතු ණය පොළී කපා හැරීම් ලෙස වෙනත් ආදායම් ගිණුම බැර කර තිබුණි. මෙම ගෙවිය යුතු ණය පොළී ගණනය කිරීමේ නිරවද්‍යතාවය විගණනයට තහවුරු නොවූ අතර, එම ණය පොළී කපා හැරීමටද බැංකුව මඟින් ලිඛිත අවසර ලබාගෙන නොතිබුණි.

(ඉ) 1981 වර්ෂයේදී ආරම්භ කරන ලද සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වලින් සියයට 62.45 ක හිමිකාරත්වයක් සංස්ථාව සතු වුවද, එම ආයෝජනය සඳහා පසුගිය වසර 27 ක කාලය තුළ කිසිදු ප්‍රතිලාභයක් සංස්ථාව වෙත ලබාදී නොතිබුණි.

(ඊ) 1967 ජූලි 12 දිනැති අංක 14756/7 දරන අති විශේෂ ගැසට් නිවේදනය සහ අංක 288 දරන ඔප්පුව මඟින් කොල්ලුපිටියේ පිහිටි පර්චස් 89.9 ක ඉඩම සංස්ථාවට හිමිවී තිබුණි. 2017 වර්ෂයේ තක්සේරු වාර්තා අනුව වටිනාකම රු.735,000,000 ක් වූ මෙම ඉඩම රාජ්‍ය බැංකුවකට උකස් කර ණය ලබාගෙන තිබූ අතර, සමාලෝචිත වර්ෂය

අවසාන දිනට හිඟ ණය ශේෂය රු.97,700,000 ක් විය. ගාලු පාරට යාබදව පිහිටි මෙම ඉඩම ඵලදායී කාර්යයකට යොදා නොගෙන නිෂ්ක්‍රීය වත්කමක් ලෙස පැවතුණි.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

2016 ජූලි මාසයේදී ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර සංස්ථාවේ සේවකයන් විශ්‍රාම යැවීමෙන් පසුව සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ අභ්‍යන්තර විගණනය සඳහා කිසිම නිලධාරියෙකු සේවයේ යොදවා නොතිබූ අතර, වර්ෂය තුළ සංස්ථාවේ අභ්‍යන්තර විගණනයට අදාළව කිසිදු කාර්යයක් ඉටු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

මූල්‍ය තත්ව ප්‍රකාශනය

2018 දෙසැම්බර් 31 දිනට		**2018**	**2017**
වත්කම්	**සටහන්**	**රු.**	**රු.**
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	**03**	1,457,296	1,589,512
ආයෝජන දේපල	**04**	796,950,000	796,950,000
දිගුකාලීනව ලැබිය යුතු දෑ	**05**	-	-
වෙනත් ආයෝජනයන්	**06**	630,226,056	629,752,312
		1,428,633,352	**1,428,291,824**
ජංගම වත්කම්			
තොගය	**07**	925,486	1,241,757
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	**08**	72,999,219	74,469,339
මුදල් හා මුදල් සමාන දෑ	**09**	19,867,979	9,157,568
		93,792,684	**84,868,664**
මුළු වත්කම්		**1,522,426,036**	**1,513,160,488**
හිමිකම් හා වගකීම්			
හිමිකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය		966,971,845	966,971,845
පොදු සංචිත		9,996,952	9,996,952
ප්‍රත්‍යාගණන සංචිත		561,202,984	561,202,984
රදවාගත් ඉපැයුම්		(181,898,802)	(197,585,836)
විකිණීම සඳහා වූ වත්කම්වලට අදාළ සංචිත		(465,956,132)	(465,956,132)
මුළු හිමිකම		**890,316,847**	**874,629,812**
ජංගම නොවන වගකීම්			
පොලී ගෙවිය යුතු දිගුකාලීන වගකීම්	**10**	93,700,000	-
දිගුකාලීනව ගෙවිය යුතු දෑ	**12**	492,426,190	492,426,190
විශ්‍රාම පාරිතෝෂික අරමුදල	**13**	4,012,838	3,795,861
		590,139,028	**496,222,051**
ජංගම වගකීම්			
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ	**14**	36,823,993	42,317,003
පොලී ගෙවිය යුතු කෙටිකාලීන වගකීම්	**10**	4,000,000	97,793,352
උපචිත බැංකු ණය පොලී	**11**	1,146,168	2,198,270
මුදල් හා මුදල් සමාන දෑ	**09**	-	-
		41,970,161	**142,308,625**
මුළු වගකීම්		**632,109,189**	**638,530,676**
මුළු හිමිකම් හා වගකීම්		**1,522,426,036**	**1,513,160,488**

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 25 සිට 28 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 29 සිට 35 දක්වා සටහන් ඇතුලත් වේ.

අත්සන් කලේ, *අත්සන් කලේ,*

එම්.ජී.ඒ.ටී.ආර්.ජයතිලක - ගණකාධිකාරී **එස්.අබ්ඩීන් එහියා - කළමණාකාර අධ්‍යක්ෂ**

මෙම මූල්‍ය ප්‍රකාශන සාධාරණ ලෙස පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. මූල්‍ය ප්‍රකාශන අනුමත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරනුයේ,

අත්සන් කලේ, **අත්සන් කලේ,**

එම්.අබ්දුල් රෂීක් - **අධ්‍යක්ෂ** එම්.රියාස් එස්.සාලී මහතා - **සභාපති**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

විස්තීරණ ආදායම් හා රදවා ගත් ඉපැයුම් ප්‍රකාශනය
2018 දෙසැම්බර් **31**න් අවසන් වර්ෂය සඳහා

	සටහන්	2018	2017
		රු.	රු.
ආදායම්	**15**	36,064,670	15,130,564
විකුණුම් පිරිවැය	**උපලේඛන. I**	(316,271)	(16,215,007)
දළ අලාභය		**35,748,399**	**(1,084,443)**
වෙනත් ආදායම්	**16**	15,375,443	56,554,892
බෙදාහැරීම් වියදම්	**උපලේඛන.II**	-	(271,560)
පරිපාලන වියදම්	**උපලේඛන. III**	(16,882,861)	(20,523,572)
මූල්‍ය වියදම්	**17**	(14,652,301)	(16,500,602)
බදු පෙර ලාභය	**18**	**19,588,680**	**18,174,716**
බදු පිරිවැය		(3,630,250)	(2,876,611)
වර්ෂයට අදාළ ලාභය		**15,958,430**	**15,298,106**
වෙනත් විස්තීරණ ආදායම්/(වියදම්)	**19**	-	585,513
පෙර වර්ෂ සඳහා ගැලපීම්	**20**	(271,396)	(3,179,933)
මුළු විස්තීරණ ආදායම්/(වියදම්)		**15,687,034**	**12,703,686**
වර්ෂ ආරම්භයේ රදවාගත් ඉපැයුම්		(663,541,968)	(676,245,654)
වර්ෂ අවසානය රදවාගත් ඉපැයුම්		**(647,854,934)**	**(676,541,968)**

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 25 සිට 28 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 29 සිට 35 දක්වා සටහන් ඇතුලත් වේ.

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

2018 දෙසැම්බර් සම 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	2017.01.01 දිනට ශේෂය	**2017** වර්ෂයට අදාළ	පුනප්‍රකාශිත **2017. 12. 31** දිනට ශේෂය	**2018** වර්ෂයට	**2018. 12. 31** දිනට ශේෂය
ප්‍රකාශිත ප්‍රාග්ධනය	966,971,845	-	966,971,845	-	966,971,845
ප්‍රත්‍යාගණිත සංචිත	536,119,419	25,083,565	561,202,984	-	561,202,984
පොදු සංචිත	9,996,952	-	9,996,952	-	9,996,952
රදවාගත් ඉපැයුම්	(210,289,522)	12,703,686	(197,585,836)	15,687,034	(181,898,802)
විකිණිම සඳහා වූ වත්කම්වලට අදාළ සංචිත	(465,956,132)	-	(465,956,132)	-	(465,956,132)
මුළු එකතුව	**836,842,562**	**37,787,251**	**874,629,813**	**15,687,034**	**890,316,847**

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 25 සිට 28 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 29 සිට 35 දක්වා සටහන් ඇතුලත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	2018 රු.	2017 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
වර්ෂයට අදාළ බදු පෙර ලාභය		19,588,680	18,174,716
මුදල්මය නොවූ ආදායම්/(වියදම්) ගැලපීම :			
දේපල, පිරියත හා උපකරණවල ක්ෂය වෙන්කිරීම්	**03**	132,216	173,873
පාරිතෝෂික වෙන්කිරීම්		322,533	331,100
මුදල්යම නොවූ බැංකු ණය පොලී		14,652,301	16,500,602
සේවක ණයවලට අදාළ පොළී		-	(110,676)
තැම්පත්වලට අදාළ පොළී		(1,618,681)	(1,549,315)
භාණ්ඩාගාර බිල්පත්වලට පොළී		(473,744)	(501,660)
බැංකු ණය කපාහැරීම්		-	(16,144,188)
මුදල්මය නොවූ නිවාස ණය පොලී		-	12,297
දේපල, පිරියත හා උපකරණ විකුණුම් ලාභය		(10,065,512)	(673,005)
		22,537,793	**16,213,744**
මෙහෙයුම් වත්කම් හා වගකීම්වල වූ වෙනස්කම්			
තොගයේ සිදු වූ අඩුවීම්/(වැඩිවීම්)	**07**	316,271	1,857,921
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දැනි වූ අඩුවීම්/(වැඩිවීම්)	**08**	1,444,458	15,151,959
ගෙවිය යුතු බැංකු ණය පොළීහි වූ වැඩිවීම් /(අඩුවීම්)	**10**	(1,052,102)	(3,425,452)
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දැනි වූ වැඩිවීම් /(අඩුවීම්)	**14**	(9,891,731)	(4,703,609)
		13,354,689	**25,094,563**
අඩුකිරීම් :			
පාරිතෝෂික ගෙවීම්	**13**	-	(513,522)
පොළී ගෙවීම්		(3,842,234)	(18,922,737)
බදු ගෙවීම්		(247,480)	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්		**9,264,975**	**5,658,304**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
තැම්පතුවල ආයෝජනය කිරීම්	**08**	(35,000,000)	(30,501,660)
තැම්පතු මුදල් කර ගැනීම්		19,741,164	31,549,315
වත්කම් මිලදී ගැනීම්		-	(148,310)
වත්කම් විකිණීම්		-	3,094,010
භාණ්ඩාගාර බිල්පත්වල කරන ලද ආයෝජනයන්		(1,271,367)	-
භාණ්ඩාගාර බිල්පත්වලට අදාළ පොළී ලැබීම්		1,271,367	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්		**(15,258,836)**	**3,993,355**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
ණය හා අනෙකුත් ණය පහසුකම් පියවීම්		(93,352)	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්		**(93,352)**	**-**
වර්ෂය තුල මුදල් හා මුදල් සමාන දැනි		(6,087,213)	9,651,659
මුදල් හා මුදල් සමාන දැනි වර්ෂ ආරම්භක ශේෂය	**13 & 14**	9,157,568	(494,091)
බැංකුගත මුදල්හි වර්ෂ අවසාන ශේෂය		3,070,355	9,157,568
කෙටිකාලීන මුදල් තැම්පතු		16,797,624	
මුදල් හා මුදල් සමාන දැනි වර්ෂ අවසාන ශේෂය		**19,867,979**	**9,157,568**

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 25 සිට 28 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 29 සිට 35 දක්වා සටහන් ඇතුලත් වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්
2018 දෙසැම්බර් **31**න් අවසන් වර්ෂය සඳහා

1.සාමාන්‍ය තොරතුරු

1950 වර්ෂයේදී කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලද කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව 1955 අංක 19 දරණ රාජ්‍ය අනුග්‍රහයලත් සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1956 වර්ෂයේ රාජ්‍ය සංස්ථාවක් බවට පරිවර්තනය කරන ලදුව කන්කසන්තුරේ සිමෙන්ති කම්හල නමින් ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.
ඉන්පසුව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1959 ජනවාරි 01දා සිට ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය නමින් නැවත ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.

1980 වර්ෂයේදී අතිවිශේෂ ගැසට්පත්‍රයේ නිවේදනයට අනුව මෙහි නම ‘‘ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව’’ ලෙස සංශෝධනය කරන ලදි. මෙහි ප්‍රධාන කාර්යාලය අංක 130, ඩබ්.ඒ.ඩී.රාමනායක මාවත, කොළඹ 03 යන ස්ථානයේ පිහිටා ඇත. වර්තමානයේ මෙහි ප්‍රධාන කාර්‍යයන් ලෙස සාමාන්‍ය පොට්ලන්ඩ් සිමෙන්ති ආනයනය කර බෙදාහැරීම සහ කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන නිපද වීම හා අලෙවිය සිදු කරනු ලබයි.

ලංකා සිමෙන්ති සමාගමේ ආසන්න හා අවසාන හිමිකාරීත්වය දරනුයේ ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වේ.

2.වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පාදක කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත සඳහන් වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනසක් සිදු කල බව සඳහන් වේනම් මිස මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති වර්ෂය පුරාම ඒකාකාරිව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පාදක කරගෙන ඇත.

2.1.මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ලංකා ගිණුම්කරණ ප්‍රමිත පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රකාශිත වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිත අතර එය ආසන්න රුපියලට වටයා ඇත.

2.1.1.දිගුකාලීන පැවැත්ම

ආයතනයේ අධ්‍යක්ෂවරුන් විසින් ආයතනයේ දිගුකාලීන පැවැත්ම පිළිබඳ අධ්‍යනයක් සිදු කර දිගුකාලීන පැවැත්මට ඇති හැකියාව පිළිබඳ සොයා බැලිය යුතු අතර ආයතනය ඈවර කිරීමක් හෝ අහෝසි කිරීමක් සිදු කිරීමට අදහස් නොකල යුතුවේ.

2.2.ආශ්‍රිතයන්හි කරන ලද ආයෝජනයන්

2.2.1.පරිපාලිතයන්

1981වර්ෂයේදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් ලංකා සිමෙන්ති සමාගමේ රු.1,083,618,910/-ක් ආයෝජනය කල අතර එහි 62.45%ක කොටස් හිමිකාරීත්වයක් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට හිමිය. එහි සම මිල රු.10/-කි. මෙම ආයෝජනයට මේ වන තුරු ප්‍රතිලාභ ලැබී නොමැත.
මෙම ආයෝජනය පිරිවැයට පොත්වල සටහන් කර තිබූ අතර 2013 වර්ෂයේ සිට එය වෙළඳපොළ අගය පදනම් කර ගනිමින් ගිණුම්ගත කර ඇත. එහිදී හඳුනාගනු ලබන අලාභ තත්වයන් අදාළ වර්ෂයේදී විස්තීරණ වියදම් යටතේ දක්වනු ලබන අතර ඒවායේ එකතූන් හිමිකම් යටතේ විකිණීම සඳහා වූ වත්කම්වලට අදාල සංචිත ලෙස දක්වනු ලැබේ.

2.2.2.ආශ්‍රිතයන්

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් ලෆාජ් සිමෙන්ති සමාගමේ රු.6,400,000/-ක් ආයෝජනය කර ඇත. එය පිරිවැයට පොත්වල සටහන් කර ඇත.මෙම ආයෝජනයන්ට අදාලව ලාභාංශ ලැබීමක් වේනම් එම ලැබීම වෙනත් ආදායම් ශීර්ෂය යටතේ දක්වනු ලැබේ.

2.3.අයභාරය හඳුනාගැනීම

සිමෙන්ති ආනයනය කර බෙදා හැරීම සහ කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම තුලින් ජනිත වන ආදායම් සහ ඊට අදාල වියදම් , එහි ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුලට ගලා ඒමේ සම්භාවිතාවය සැලකිල්ලට ගනිමින් විශ්වාසවන්ත පදනමක් මත කාලපරිච්ඡේදයට අදාල ප්‍රමාණය මිනුම් කර හඳුනාගනු ලැබේ.

අ. භාණ්ඩ විකිණීම

කාලපරිච්ඡේදයට අදාල භාණ්ඩ විකිණීම් ආදායම හඳුනාගනු ලබනුයේ විකුණූ භාණ්ඩවල අවධානම හා එවායේ අයිතිය ගැනුම්කරු වෙත පැවරීමෙන් පසුව වේ.

ආ. සේවා සැපයීම

සේවා සැපයීමට වෙනුවෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලබනුයේ එම සේවයෙන් සම්පූර්ණ කරන ලද ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් හා ඊට අදාලව ගිවිසුමේ ඇස්තමේන්තුගත කල සම්පූර්ණ මිනිස් පැය ප්‍රමාණය, භාවිතා කරන ලද මිනිස් පැය ප්‍රමාණය සැලකිල්ලට ගනිමිනි.
ගිවිසුමට අදාල ආදායම් විශ්වාසනීයව මැනිය නොහැකි වූ විට ඊට දරණ ලද වියදම් පදනම් කරගනිමින් ආදායම් හඳුනා ගනු ලැබේ.

ඇ.පොලී

කාල අනුපාතය පදනම් කර ගනිමින් මෙම පොලී ආදායම් හඳුනාගනු ලබනුයේ වත්කම්වලට අදාල සඵල පොලී අනුපාතය සැලකිල්ලට ගනිමිනි.

ඈ.වෙනත්

උපචිත පදනම මත වෙනත් ආදායම් හඳුනා ගනු ලැබේ.

2.4.රජයෙන් ලද ලැබීම්

ආදායම් ස්භාවයේ ප්‍රදානයන් හා සහනාධාර

ආයතනය විසින් දැරිය යුතු වූ යම් වියදමක් හෝ පාඩුවක් වෙනුවෙන් ලද නැවත ගෙවිය යුතු නොවන ප්‍රදානයක් හෝ සහනාධාරයක් ලැබීම එම වියදම හෝ පාඩුව හඳුනාගන්නා ලද කාලපරිච්ඡේදයට අදාල වන පරිදි ක්‍රමානුකූල පදනමක් යටතේ ගිණුම්ගත කරනු ලැබේ.

2.5.ණය පිරිවැය

යම් කාලපරිච්ඡේදයක් තුල දරණ ලද ණය සඳහා වූ පිරිවැය එම කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

2.6.ආදායම් බදු

කාලපරිච්ඡේදයට අදාල බදු පෙර ශුද්ධ ලාභයට/(අලාභයට) කරනු ලබන එකතු කිරීම් හා අඩුකිරීම් වලින් පසු අදාල වන බදු අනුපාතය ඊට ගැලපීමෙන් පසු ලැබෙනුයේ ආදායම් බදු පිරිවැය වේ.

කාලපරිච්ඡේදයට අදාල ආදායම් බදු පිරිවැයෙන්, කාලපරිච්ඡේදය තුල ගෙවන ලද ආදායම් බදු ගෙවීම් හා ආර්ථික සේවා ගාස්තු ලෙස හිලව් කර ගත හැකි ප්‍රමාණයන් ගැලපීම් කිරීමෙන් ලැබෙන අගය ගෙවිය යුතු ආදායම් බදු ලෙස හඳුනාගනු ලැබේ.

2.7.දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ වල වටිනාකම මනිනු ලබනුයේ ඒවායේ පිරිවැයෙන් ඊට අදාල සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානි අඩුකිරීමෙනි.

ක්ෂය වීම් ගණනය කිරීමේදී සෘජු ක්‍රමය භාවිතා කරන අතර එහිදී අදාල වත්කමේ පිරිවැයෙන් එහි අවශේෂ පිරිවැය අඩුකර එම වටිනාකම වත්කමේ ඵලදායී ජීව කාලය පුරා ඇස්තමේන්තු කිරීමෙනි.

ක්ෂය ගණනයේදී පහත දැක්වෙන වාර්ෂික ක්ෂය අනුපාත පදනම් කර ගනු ලැබේ.

විස්තරය	**ක්ෂය අනුපාතය**
ගොඩනැගිලි	6.67%
යන්ත්‍ර සූත්‍ර	12.5%
පස් ප්‍රවාහන යන්ත්‍ර හා බර යන්ත්‍රෝපකරණ	25.0%
මොටර් රථ වාහන	25.0%
මෙවලම් හා උපකරණ	25.0%
ලී බඩු හා සවිකිරීම්	25.0%
රේල් පීලි	10.0%

වත්කමට අදාල ක්ෂය අනුපාතයන්හි ඵලදායී ජීව කාලයෙහි හෝ අවශේෂ පිරිවැයෙහි සැලකිය යුතු වෙනසක් සිදු වේ නම් එම වත්කම ක්ෂය කිරීම අතීත කාලයට බලපාන පරිදි ගැලපීම් කරනු ලැබේ.
රු.10,000/-ට අඩු වටිනාකමක් සහිත දේපල පිරියත උපකරණ ප්‍රාග්ධනිත නොකිරීම හා එය මිලදී ගනු ලැබූ වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගැනීම ආයතනයේ ප්‍රතිපත්තිය වේ.

2.8.ආයෝජන දේපල

අ.පුත්තලම, අරුවක්කාලුහි පිහිටි ඉඩම

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් අක්කර 5,352කින් යුතු ඉඩම 1993වසරේදී 50ක කාලයකට හොලිසීම් ලංකා සමාගමට බදු ගිවිසුමක් යටතේ බදු දී ඇත. මෙම ඉඩමේ වටිනාකම ගිණුම්ගත කිරීම සඳහා තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති අතර එය ලද විගස ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

ආ.කොල්ලුපිටියේ හා පුත්තලමේ පිහිටා ඇති ඉඩම්

යම් දේපලක් තුලින් කුලී ආදායමක් ඉපයනු ලබන්නේ නම් හෝ එහි ප්‍රාග්ධනිත අගයෙහි වටිනාකම වැඩිවේ නම් හෝ එම කරුණු දෙකම වේ නම් එය ආයෝජන දේපලක් වේ. නමුත් එම දේපල සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු ලෙස විකුණනු ලබන්නක් , නිෂ්පාදන සැපයුමක්, සේවා සැපයුමක් හෝ පරිපාලන කටයුතු සඳහා යොදා නොගන්නා දේපලක් වේ. ආයෝජන දේපලවල වටිනාකම සාධාරණ අගය මත පදනම්ව හෝ ඒවායේ පිරිවැයෙන් ඊට අදාල සියලු සමුච්චිත හානි අඩුකිරීමෙන් ලැබෙන අගය මත පදනම්ව අගය කල හැක.

ඇ.දුම්රිය මෙහෙයුම් මැදිරි

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ මෙහෙයුම් කටයුතු සඳහා මෙම දුම්රිය මෙහෙයුම් මැදිරි භාවිතා කර ඇත. ඒවා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව සාධාරණ අගය පදනම් කර ගනිමින් ආයෝජන දේපල ලෙස හඳුනාගෙන තිබෙන අතර එය පොත් වල සටහන් කර ඇත.
මෙම දේපලට අදාලව ඉදිරියට ගෙන යනු ලබන අගයෙහි වැඩිවීමක් තිබේනම් පෙරදී හඳුනාගනු ලැබූ හානි සඳහා පියවීම් කර ඉතිරියක් වේනම් එය ප්‍රත්‍යාගණිත සංචිතයට හඳුනාගනු ලැබේ. එම වටිනාකමේහි අඩුවීමක් වේනම් එය වෙනත් විස්තීරණ ආදායම්/(වියදම්) යටතේ හඳුනාගත යුතුවේ.

2.9.කල්බදු

කල්බදු වර්ගීකරණයේදී මූල්‍ය කල්බදු ලෙස හඳුනාගනු ලබනුයේ කල්බද්ධට අදාල වත්කමේ අයිතියෙහි අවධානම හා විපාකය කල්බදු දෙනු ලබන අවස්ථාවේදීම ආයතනයට මාරු වන්නේ නම් පමණි. අනෙකුත් කල්බදු මෙහෙයුම් කල්බදු ලෙස හඳුනාගනු ලැබේ.

මූල්‍ය කල්බදු වත්තම්හි සාධාරණ අගය (කල්බදු වාරිකයන්හි වර්තමාන වටිනාකම යන දෙකෙන් අඩු අගය) පදනම් කර ගනිමින් ආයතනය සතු වත්කමේ වම්නාකම සඳුනාගනු ලැබේ. කල්බදු හිමියා විසින් මෙහි වන වගකීම ඔහුගේ මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ඇතුලත් කරනු ලැබේ. කල්බදු වාරිකය තුල කල්බදු සඳහා වන පොලීය හා කල්බදු වගනීමෙන් අඩු වන ප්‍රමාණයද අඩංගු වේ. කල්බදු සඳහා වන පොලිය වියදමක් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ඇතුලත් කරනු ලැබේ. මූල්‍ය කල්බදු යටතේ අත්පත් කරගනු ලැබූ වත්කම් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ යටතේ නිරූපණය කරනු ලැබේ.
මෙහෙයුම් කල්බදු යටතේ ගෙවනු ලබන වාරික ගෙවීම් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ වියදම් යටතේ නිරූපණය කරනු ලැබේ.

2.10.තොගය

තොගයෙහි වටිනාකම ලෙස ගිණුම්ගත කරනුයේ එහි පිරිවැය හෝ විකුණුම් අගයෙන් විකුණුම් හා සම්බන්ධ පිරිවැයන් අඩුකල පසු ලැබෙන අගය යන දෙකෙන් අඩු අගය වේ.
එනම් තොග සහ කෙරෙමින් පවතින වැඩ, ගත්මිල අනුව හෝ ශුද්ධ උපලබ්ධි අගයට තක්සේරු කිරීමෙනි.
පිරිවැය ගණනයේදී ප්‍රථමයෙන් ලද තොග ප්‍රථමයෙන් නිකුත් කිරීමේ ක්‍රමය සැලකිල්ලට ගනු ලැබේ.

2.11.වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ

බොල් ණය සහ අඩමාන ණය වෙනුවෙන් ප්‍රතිපාදන ඉන්වෙයිස් වටිනාකමින් අඩුකොට ලැබෙන වටිනාකම වෙළඳ ණයගැතියන් ලෙස දක්නු ලැබේ.

2.12. වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ

ණය පදනම යටතේ මිලදී ගනු ලබන භාණ්ඩ හා සේවා වෙනුවෙන් ඇති වන මෙම වගකීම් පොලී අය කිරීමකින් තොර වේ.
විදේශීය ගනුදෙනු සම්බන්ධයෙන් ඇති වන වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු වටිනාකම් ශී ලංකා රුපියල් වලට පරිවර්ථනය කර ගිණුම්ගත කරන ඇතර ඉන් ඇති වන විදේශීය මුදල් හුවමාරු ලාභ / (අලාභ) වේ නම් එය වෙනත් ආදායම් යටතේ නිරූපණය කරනු ලැබේ.

2.13.බැංකු ණය හා අයිරා පහසුකම්

බැංකු ණය හා අයිරා පහසුකම් සඳහා වන පොලී ගණනයේදී සළුල පොලී අනුපාතයන් පදනම් කර ගනු ලබන අතර එය මූල්‍ය වියදම් යටතේ නිරූපණය කරනු ලැබේ.

2.14.වෙන්කිරීම්, අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම්

මූල්‍ය තත්ව ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන දිනට යම් කරුණක් සම්බන්ධව වගකීමක් ඇතිවේනම් හෝ ඊට අදාළව සම්පත් ගලායාමට සම්භාවිතාවයක් තිබේනම් හා එම සම්පත් ගලායෑම ඇස්තමේන්තු කල හැකි නම් ඊට අදාළව වෙන්කිරීම් සිදු කල යුතු වේ.
ආයතනයේ සම්පත් ගලායෑමේ ප්‍රවණතාවයක් නොමැති වුවද සියලුම අසම්භාව්‍ය වගකීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන තුල සටහනක් මගින් හෙළිදරව් කල යුතු වේ.
ආයතනය තුලට සම්පත් ගලාඒමේ ප්‍රවණතාවයක් වේනම් පමණක් අසම්භාව්‍ය වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන තුල සටහනක් මගින් හෙළිදරව් කල යුතු වේ. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් වෙළඳ ලැබිය යුතු වටිනාකම් වෙනුවෙන් අධිකරණයේ නඩු දහතුනක් (13) ගොනු කර ඇත.

03. දේපල, පිරියත හා උපකරණ

පිරිවැය	2018.01.01 දිනට ශේෂය	පෙර වර්ෂ සඳහා ගැලපීම්	වර්ෂය තුල වූ එකතු කිරීම්	වර්ෂය තුල වූ අඩු කිරීම්	2018.12.31 දිනට ශේෂය
ඉඩම් හා ගොඩනැගිලි	1,595,981	-	-	-	1,595,981
මෝටර් රථ	4,562,891	-	-	-	4,562,891
ලී බඩු හා සවිකිරීම්	4,575,575	-	-	-	4,575,575
මේවලම් හා උපකරණ	288,630	-	-	-	288,630
	11,023,077	**-**	**-**	**2,228,356**	**11,023,077**

සමුච්චිත ක්ෂය වෙන්කිරීම්	2018.01.01 දිනට ශේෂය	පෙර වර්ෂ සඳහා ගැලපීම්	වර්ෂයට අදාළ ක්ෂය කිරීම්	වර්ෂයට අදාළ ඉවත්කිරීම්	2018.12.31 දිනට ශේෂය
ඉඩම් හා ගොඩනැගිලි	395,981	-	-	-	395,981
මෝටර් රථ	4,562,891	-	-	-	4,562,891
ලී බඩු හා සවිකිරීම්	4,188,933	-	129,346	-	4,318,279
මේවලම් හා උපකරණ	285,760	-	2,870	-	288,630
	9,433,565	**-**	**132,216**	**-**	**9,565,781**
ශුද්ධ පොත් අගය	**1,589,512**				**1,457,296**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් අක්කර 751කින් යුතු ඉඩමක් කන්කසන්තුරේ පිහිටා තිබෙන අතර එම ඉඩමේ වටිනාකම ගිණුම්ගත කර නොමැත.
මෙම මුළු ප්‍රමාණයෙන් අක්කර 241ක් පිඹුරුපත් අංක ඒ 2099 යටත් රජයෙන් ලද ඉඩමක් වන අතර එය අංක : 12,156 දරණ 1960 ජූලි 08වන දිනැති ගැසට් පත්‍රය මගින් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට පවරා ඇත. කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව, එහි පරිපාලන ගොඩනැගිලි හා තෙල් ටැංකි සංකීර්ණය මෙම භූමි ප්‍රමාණය තුල ඉදිකර ඇත.ඉතිරි ප්‍රමාණය වන අක්කර 520ක ප්‍රමාණය පිඹුරුපත් අංක ඒ1557, ඒ1484, ඒ1562 හා ඒ2438 හි ඇතුලත් වන අතර එය 1964 අංක 14,012දරණ ඉඩම් අත්පත් කර ගැනීමේ ගැසට් පත්‍ර යේ වගන්ති අංක 460 යටතේ වන්දි ගෙවා අත්පත් කරගෙන ඇත.

උතුරු පළාත සංවර්ධනය කිරීමට අදාළ වැඩසටහන් හා සම්බන්ධව ජනාධිපති කාර්යසාධන බලකාය විසින් එම වැඩසටහන් සඳහා ඉහත සඳහන් ඉඩම් යොදාගැනීමේ හැකියාව පිළිබඳව සාකච්ජා පවත්වන ලදී. එම ඉඩමෙන් කොටසක් ලබා දෙන ලෙස විවිධ ආයතන වලින් ලද ඉල්ලීම් හා රට තුල අවතැන් වූ පුද්ගලයන්හට ලබාදෙන ලද ඉඩම් ප්‍රමාණයන් හා අනවසරයෙන් පුද්ගලයින් පදිංචි වී තිබෙන ඉඩම් පුමාණයන් පහත පරිදි වේ.

ආයතනයේ නම	ප්‍රමාණය (අක්කර)	වෙනත් කරුණු
ශ්‍රී ලංකා යුධ හමුදාව	50	මෙම ඉඩම් වන්දි ලබාගැනීම යටතේ එම ආයතන සඳහා නිදහස් කිරීම සඳහා වූ අනුමැතීන් පිළිබඳව 2019.02.29 දින වාණිජ්‍ය හා කර්මාන්ත කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා දැනුවත් කරන ලදි.
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	50	
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම	06	
ගැසට් පත්‍රයක් මගින් රට තුල අවතැන් වූ පුද්ගලයන්හට	45	
අනවසරයෙන් පුද්ගලයින් පදිංචි වී තිබෙන ඉඩම් පුමාණයන්	50	
පරිසර හිතකාමී කර්මානතපුරය සඳහා	330	2018.09.10 වන දින මේ පිළිබඳව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පිහිටා ඇති අක්කර 6කින් යුත් සංස්ථාව සතු ඉඩමේ වටිනාකම, ඉඩම් හා ගොඩනැගිලි පිරිවැය තුල ඇතුලත් වේ. සංස්ථාවේ අනුමැතියකින් තොරව සුනාමි නිවාස , ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මුල් වී ඉදිකර ඇති බැවින් මීට සුදුසු වන්දි මුදලක් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවති.

04. ආයෝජන දේපල	2018 රු.	2017 රු.
ඉඩම - කොළඹ 02	735,000,000	735,000,000
ඉඩම - පාලාවි	61,200,000	61,200,000
දුම්රිය මෙහෙයුම් මැදිරි	750,000	750,000
	796,950,000	**796,950,000**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු නො.287, ගාලු පාර, කොළඹ 02 ලිපිනයෙහි පිහිටි ඉඩමේ වටිනාකම ආයොජන යටතේ දක්වා ඇත. මෙම ඉඩම උගස් බැදුම්කර අංක 2426 යටතේ රු.172,000,000/-ක් දක්වා ණය පහසුකම් ලබා ගැනීමට 2008.02.25 වන දින උගස් කර ඇත. මෙම ඉඩම 2013 හා 2017 යන වර්ෂවලදී පිළිවෙළින් රු.712,500,000/-ක් හා රු.735,000,000/-ක් ලෙස ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර ඇත.

පුත්තලම පාලාවිහි පිහිටි අක්කර 221කින් යුතු ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු ඉඩමේ අක්කර 170 : රූඩ් 3: පර්චස් 28.3ක් 2013 වර්ෂයේදී තක්සේරු කල අතර එය ගිණුම්ගත කර ඇත. ඉතිරි අක්කර 51ක ප්‍රමාණය තක්සේරුකර ගිණුම්ගත කර නොමැත.

ශ්‍රී ලංකා සමෙන්ති සංස්ථාවට අයත් අක්කර 12 : රූඩ් 3: පර්චස් 30කින් යුත් පුත්තලම පාලාවිහි පිහිටි ඉඩම සියාම් සිටි සිමෙන්ති සමාගමට කල්බදු පදනම මත අත්සන් කරන ලද ගිවිසුම් අංක : 26 යටතේ 2003.06.06 දින ලබා දී ඇත.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් කොල්ලුපිටියේ පිහිටි ඉඩමේ වටිනාකම් ආයෝජන වත්කම් ලෙස සාධාරණ අගය මත ලංකා ගණකාධිකරණ ප්‍රතිපත්ති අංක 40 (ආයෝජන වත්කම්) හිප්‍රතිපාදන අනුව හඳුනාගෙන ඇත. තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2013 ඔක්තෝම්බර් මස02 වන දින නිකුත් කරන ලද තක්සේරු වාර්තාව පදනම් කරගනිමින් මෙම වටිනාකම් ගිණුම්ගත කර ඇත.

		2018	2017
05.	**දිගුකාලීනව ලැබියු යුතු දෑ**	**රු.**	**රු.**
	ලංකා සිමෙන්ති සමාගම ස්ථාපිත කිරීමට අදාළ දිගු කාලීන හා කෙටි කාලීනව ලැබිය යුතු වූ දෑ	360,311,323	424,169,977
	ලංකා සිමෙන්ති සමාගම හා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව අතර සිදු වූ අභ්‍යන්තර ගනුදෙනු සඳහා ලැබිය යුතු වූ දෑ	396,912,560	333,053,906
	ලංකා සිමෙන්ති සමාගමෙන් ලැබිය යුතු දෑ වෙනුවෙන් කරන ලද වෙන්කිරීම්	(757,223,883)	(757,223,883)
		-	-
06.	**ආයෝජනයන්**		
	භාණ්ඩාගාර බිල්පත්	6,163,277	5,689,533
	පරිපාලිනයන් සහ ආශ්‍රිතයන්ගේ ආයෝජනයන්		
	පරිපාලිත - ලංකා සිමෙන්ති සමාගම	617,662,779	617,662,779
	ලෆාජ් සිමෙන්ති (පෞද්.) සමාගම	6,400,000	6,400,000
		630,226,056	**629,752,312**
07.	**තොගය**		
	කොන්ක්‍රීට් නිෂ්පාදන අංගනයේ අමුද්‍රව්‍ය හා නොනිමි වැඩ	238,256	238,256
	කොන්ක්‍රීට් නිෂ්පාදන අංගනයේ නිමි තොගය	687,230	1,003,501
		925,486	**3,099,678**
08.	**වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ**		
	වෙළඳ ණයගැතියෝ	49,425,414	51,952,363
	අඩමාණ ණය වෙන් කිරීම්	(977,166)	(977,166)
	ලැබිය යුතු කුලී	2,515,440	2,517,154
	දේශ්‍රීය ඇණවුම් මත කලින් ලැබීම්	1,131,622	1,131,622
	ලැබිය යුතු තැම්පත්	1,624,626	1,708,125
	සිමෙන්ති මත ලැබිය යුතු තැම්පත්	976,971	976,971
	සේවක ආපදා ණය/මෝටර් බයිසිකල් ණය හා අනෙකුත්	2,519,141	2,061,696
	කලින් ගෙවූ වියදම්	278,601	313,378
	ලංකා සිමෙන්ති සමාගමෙන් ලැබිය යුතු දෑ	1,253,580	253,580
	විවිධ අත්තිකාරම්	240,947	240,947
	භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු දෑ	48,000	48,000
	ලැබිය යුතු එකතු කල අගය මත බදු	10,414,117	10,694,743
	ලැබිය යුතු ආර්ථික සේවා ගැස්තු	126,758	126,758
	ලැබිය යුතු රදවාගත් බදු	2,748,462	2,748,462
	එන්.එච්.ඩී.ඒ. ආයතනයෙන් ලැබිය යුතු දෑ	672,706	672,706
		72,999,219	**74,469,339**
09.	**මුදල් හා මුදල් සමාන දෑ**		
	බැංකුවේ තිබෙන මුදල්		
	- ලංකා බැංකුව, ලේක් වීව් ශාඛාව	1,332,786	2,156,449
	- ලංකා බැංකුව, ආයතනික ශාඛාව	19,594	874,820
	- මහජන බැංකුව, විදේශ අංශය	-	252,754
	- මහජන බැංකුව, ලිබර්ටි ප්ලාසා ශාඛාව	1,717,975	5,501,747
	- මහජන බැංකුව, කන්කානේටිටි ශාඛාව	-	371,798
	කෙටිකාලීන බැංකු තැම්පතු	16,797,624	-
		19,867,979	**9,157,568**

		2018	**2017**
10.	**පොළී ගෙවිය යුතු වගකීම්**	**රු.**	**රු.**
	බැංකු ණය		
	ලංකා බැංකුව, ණය අංකය - 74129310	-	24,000,000
	ලංකා බැංකුව, සිමෙන්ති ආනයනය කිරීමට අදාළ ණය	-	56,293,352
	ලංකා බැංකුව, ණය අංකය - කෙටිකාලීන ණය	-	17,500,000
	ලංකා බැංකුව, ණය අංකය - 83124176	97,700,000	-
		97,700,000	97,793,352
		97,700,000	**97,793,352**
11.	**ගෙවිය යුතු ණය පොළී**		
	ගෙවිය යුතු බැංකු අයිරා පොළී	-	1,453,715
	ගෙවිය යුතු බැංකු ණය පොළී	1,146,168	744,555
		2,198,270	**2,198,270**
12.	**දිගුකාලීන වගකීම්**		
	භාණ්ඩාගාර අත්තිකාරම්	492,426,190	492,426,190
		492,426,190	**492,426,190**
13.	**විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම්**		
	වර්ෂ ආරම්භක දිනට විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම් ශේෂය	3,795,861	3,297,663
	වර්ෂය තුල ණය මත කල කපාහැරීම්	(105,556)	-
	වර්ෂය තුල මුදලින් කල ගෙවීම්	-	(603,540)
		3,690,305	2,694,123
	වර්ෂයට අදාළ වෙන්කිරීම්	322,533	331,100
	වර්ෂ අවසාන දිනට විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම් ශේෂය	**4,012,838**	**3,795,861**
14.	**වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ**		
	වෙළඳ ණයහිමියෝ	3,090,311	3,644,844
	සිමෙන්ති අත්තිකාරම්	1,079,410	1,079,410
	උපචිත වියදම්	3,816,615	4,092,771
	බී.සී.සී. ආයතනයට ගෙවිය යුතු කුලී	766,150	766,150
	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවිය යුතු කුලී	6,322,724	8,322,724
	ගෙවිය යුතු තැම්පතු	1,329,176	1,285,626
	ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු	126,756	126,756
	ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු	1,946,818	8,410,618
	වැටුප් පාලන ගිණුම	140,754	177,656
	නොගෙවූ වැටුප්	51,645	53,070
	රදවාගත් කාසි	468	468
	ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල්	104,484	97,515
	ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල්	14,354	13,404
	ගෙවිය යුතු අධ්‍යක්ෂ පාරිතෝෂික	31,631	8,182
	ගෙවිය යුතු ආදායම් බදු	5,217,349	1,355,144
	ගෙවිය යුතු උපයන විට ගෙවීම් බදු	3,445	27,782
	ගෙවිය යුතු එකතු කල අගය මත බදු	12,773,488	12,854,883
	ගෙවිය යුතු රදවා ගැනීම් මත බදු	8,415	-
		36,823,993	**42,317,003**

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්
2018 දෙසැම්බර් සම 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		2018	2017
		රු.	රු.
15.	**ආදායම්**		
	සිමෙන්ති විකුණුම්	-	14,144,593
	කොන්ක්‍රීට් කණු විකුණුම්	579,569	1,150,847
	භූණුගල් නිධිය සහිත ඉඩමෙන් ලැබෙන කල්බදු	31,703,734	30,377,665
	ඉඩම්වලින් ලැබෙන කුලී ආදායම්	4,503,870	3,960,618
	(-) ජාතිය ගොඩනැගීමේ බදු	(722,503)	(164,876)
		36,064,670	**49,468,847**
16.	**වෙනත් ආදායම්**		
	සේවක ණය මත ලද පොලී	143,481	110,676
	තැම්පතු මත ලද පොලී	1,618,681	1,549,315
	භාණ්ඩාගාර බිල්පත් මත ලද පොලී	473,744	501,660
	ස්ථාවර වත්කම් විකිණීමට අදාල ලාභ	-	673,005
	විවිධ ආදායම්	25	177,765
	සාණ්ඩාගාර ලැබීම්	-	-
	ඉඩමට ඇතුල්වීමේ ගාස්තු	3,074,000	3,060,000
	බැංකු ණය පොළී කපාහැරීම්	10,065,512	16,144,188
		15,375,443	**22,216,609**
17.	**මූල්‍ය වියදම්**		
	බැංකු අයිරා පොලී	6,559	2,267,504
	බැංකු ණය පොලී	14,645,742	14,233,098
		14,652,301	**16,500,602**
18.	**බදු පෙර ලාභය**		
	බදු පෙර ලාභය ගණනයේදී පහත සඳහන් වියදම් අඩුකර ඇත:		
	සේවක පිරිවැය	8,860,320	7,555,455
	අධ්‍යක්ෂ පාරිතෝෂික	3,463,365	3,368,225
	ක්ෂය වෙන්කිරීම්	132,216	173,873
	විගණන ගාස්තු	520,000	150,000
	පාරිතෝෂික වෙන්කිරීම්	322,533	331,100
19.	**අනෙකුත් විස්තීරණ ආදායම්/(වියදම්)**		
	මූල්‍ය වත්කම් මත ලාභ/(අලාභ)	-	-
	ලංකා සිමෙන්ති සමාගමෙන් ලැබිය යුතු දෑ සඳහා අඩමාණ ණය වෙන්කිරීම්	-	-
	ලොගොමෝටිව් දුම්රිය මැදිරි විකිණීම මත වූ ලාභ/(අලාභ)	-	585,513
		-	**585,513**
20.	**රදවාගත් ඉපැයුම් සඳහා කරන ලද පෙර වර්ෂ ගැලපීම්**	**රු.**	
	2016/12/31 දිනට රදාගත් ඉපැයුම්		(663,541,968)
	වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ - ගෙවිය යුතු අධ්‍යක්ෂ පාරිතෝෂික	29,873	
	වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ - ගෙවිය යුතු උපචිත වියදම්	(486,949)	
	වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ - ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු	(79,440)	
	වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ - ගෙවිය යුතු ආදායම් බදු	(479,435)	
	ගෙවිය යුතු බැංකු ණය පොලී	744,555	
			(271,396)
			(663,813,364)

21. මෙම මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි මස 26 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කල අතර නිකුත් කිරීමටද අනුමැතිය ලබාදෙන ලදි.

විස්තරාත්මක විස්තීරණ ආදායම් ප්‍රකාශනය
2018 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	යොමුව	2018 රු.	2017 රු.
ආදායම		36,064,670	49,468,847
විකුණුම් පිරිවැය	අ	(316,271)	(16,215,007)
දළ අලාභය		**35,748,399**	**33,253,841**
වෙනත් ආදායම්	ආ	15,375,443	22,216,609
බෙදාහැරීම් වියදම්	ඇ	-	-
පරිපාලන වියදම්	ඈ	(16,882,861)	(20,523,572)
මූල්‍ය වියදම්වලට පෙර ලාභය		**34,240,981**	**34,675,318**

විස්තරාත්මක විස්තීරණ ආදායම් ප්‍රකාශනය සඳහා උපලේඛන
2018 දෙසැම්බර් සම 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	2018	2017
අ. විකුණුම් පිරිවැය		
	රු.	රු.
සිමෙන්ති අලෙවිය		
ආරම්භක තොගය	-	-
මිලදී ගැනුම් හා සෘජු පිරිවැය	-	14,325,075
අඩුකිරීම් : අවසාන තොගය	-	-
	-	14,325,075
කොන්ක්‍රීට් කණු අලෙවිය		
ආරම්භක තොගය	1,003,501	3,097,767
මිලදී ගැනුම්	-	-
සෘජු පිරිවැය	-	32,011
අඩුකිරීම් : අවසාන තොගය	(687,230)	(1,239,846)
	316,271	1,889,932
	316,271	**16,215,007**
ආ. වෙනත් ආදායම්		
සේවක ණය මත ලද පොලී	143,481	110,676
තැම්පතු මත ලද පොලී	1,618,681	1,549,315
භාණ්ඩාගාර බිල්පත් මත ලද පොලී	473,744	501,660
ස්ථාවර වත්කම් විකිණීමට අදාල ලාභ	-	673,005
විවිධ ආදායම්	25	177,765
සාණ්ඩාගාර ලැබීම්	-	-
කුලී ආදායම්	3,074,000	3,060,000
බැංකු ණය කපාහැරීම්	10,065,512	16,144,188
	15,375,443	**22,216,609**
ඇ. බෙදාහැරීම් වියදම්		
මෝටර් රථ සඳහා ක්ෂය වෙන්කිරීම්	-	44,560
දැන්වීම් හා ප්‍රදර්ශන වියදම්	-	227,000
	-	**271,560**
ඇ. පරිපාලන වියදම්		
වැටුප් හා වේතන	6,376,038	6,230,565
අතිකාල ගෙවීම්	225,133	193,208
සේවක අර්ථසාධක අරමුදල් වියදම්	709,680	623,168
සේවක භාරකාර අරමුදල් වියදම්	177,420	155,792
වෛද්‍ය නිවාඩු සඳහා කල ගෙවීම්	362,611	352,722
අධ්‍යක්ෂ පාරිතෝෂික වියදම්	3,463,365	3,368,225
විගණන කමිටු රැස්වීම් වියදම්	196,000	128,000
වාර්ෂික ප්‍රසාද මුදල්	189,900	211,950
වෛද්‍ය පහසුකම්	72,082	43,412
තේ සඳහා වූ දීමනාව	157,838	67,400
	11,930,067	**11,374,442**

විස්තරාත්මක විස්තීරණ ආදායම් ප්‍රකාශනය සඳහා උපලේඛන

2018 දෙසැම්බර් සම 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2018**	**2017**
	රු.	රු.
පෙර පිටුව	**11,930,067**	**11,374,442**
ආහාර දීමනාව	366,300	354,840
සුභසාධන වියදම්	404,233	339,741
නිවාස ණය මත පොලී ප්‍රතිපූර්ණය කිරීම	8,985	12,297
ගොඩනැගිලි ක්ෂය	-	-
ලීබඩු හා සවිකිරීම් ක්ෂය	129,346	103,743
මෙවලම් හා උපකරණ ක්ෂය	2,870	25,570
කුලී වියදම්	1,009,800	1,009,366
විදුලි බිල්පත් වියදම්	176,872	275,152
තැපැල් හා දුරකථන වියදම්	227,296	349,807
මුද්‍රණ හා ලිපිලේඛන වියදම්	285,882	230,061
වරිපනම් ගාස්තු	7,700	9,533
පොදු වියදම්	378,567	319,311
ආර්ථික සේවා ගාස්තු වියදම්	-	-
ගමන් ගාස්තු වියදම්	89,979	156,052
ඉඩම් නීරික්ෂන හා අනෙකුත් වියදම්	-	1,559,880
මෝටර් රථ වියදම්	266,686	327,219
ලේකම් කටයුතු සඳහා වූ වියදම්	90,204	87,068
කාර්යාල උපකරණ අළුත්වැඩියා වියදම්	80,360	80,748
ප්‍රකාශන වියදම්	10,730	31,590
විගණන ගාස්තු	520,000	150,000
තක්සේරු ගාස්තු	-	1,736,300
පාරිතෝෂික වෙන් කිරීම්	322,533	331,100
ජල වියදම්	52,469	88,422
තොග හානී	-	-
බැංකු ගාස්තු	63,298	53,857
ආරක්ෂක වියදම්	-	512,151
ලීබඩු හා සවිකිරීම් අලුත්වැඩියා වියදම්	-	38,765
කාර්යාල අලුත්වැඩියා වියදම්	39,000	-
නීති හා වෘත්තිය ගාස්තු	5,000	28,000
තාවකාලික සේවකයින් සඳහා වූ වියදම්	414,684	938,557
සේවක වන්දි (ස්.ව.යෝ.ක්‍රමය)	-	-
	16,882,861	**20,523,572**

ආදායම් බදු ගණනය

2018 තක්සේරු වර්ෂය සඳහා

	යොමුව		+රු.	-රු.
2018 වර්ෂයට අදාළ ලාභය	**P & L**		19,588,680	
තැම්පතු මත ලද පොළී	**P & L**			1,618,681
භාණ්ඩාගාර බිල්පත් මත ලද පොළී	**P & L**			473,744
ප්‍රාග්ධන දීමනාව	**Sch. I**			97,000
ක්ෂයකිරීම්	**P & L**		132,216	
සේවක පාරිතෝෂික වෙන්කිරීම්	**P & L**		322,533	
සේවක පාරිතෝෂික ගෙවීම්	**P & L**			-
			20,043,429	**2,189,425**
ගැලපීම් කරන ලද ලාභය				**17,854,004**
පොළී ආදායම				2,092,425
මුළු ව්‍යවස්ථාපිත ආදායම්				**19,946,429**
තක්සේරු කල හැකි ආදායම				**19,946,429**
අඩුකිරීම් :				
2017 සිට ඉදිරියට ගෙන එනු ලබන අලාභය		97,032,957		
2018 වර්ෂයේ අලාභය		-		
ව්‍යවස්ථාපිත ආදායමෙන් 35%		(6,981,250)		**(6,981,250)**
2019 වර්ෂයට ගෙන යනු ලබන අලාභය		**90,051,707**		
බදු වන ලාභය				**12,965,179**
මුළු ආදායම් බදු වියදම		12,965,179	28%	3,630,250
රඳවාගැනීම් මත බදු අඩුකිරීම්	247,480			
ගෙවූ ආර්ථික සේවා ගාස්තු අඩුකිරීම්	-			
ගෙවූ ආර්ථික සේවා ගාස්තු වියදම්	-			
	247,480			(247,480)
ගෙවිය යුතු ආදායම් බද්ද				**3,382,770**

ආදායම් බදු ගණනය

2018 තක්සේරු වර්ෂය සඳහා

උපලේඛනය I - ප්‍රාග්ධන දීමනාව	අනුපාතය **%**	**පිරිවැය**	**2018 දීමනාව**
2018 වර්ෂය සඳහා	**-**	**-**	**-**
2012 ට පෙර වර්ෂ සඳහා			
ගොඩනැගිලි	6.67%	395,981	26,412
මොටර් රථ .	20%	6,650,714	-
ලීබඩු හා සවිකිරීම්	20%	546,564	-
මෙවලම් හා උපකරණ	12.5%	47,330	5,916
			32,328
2017 වර්ෂය සඳහා			
ලීබඩු හා සවිකිරීම්	20%	140,561	9,375
මෙවලම් හා උපකරණ	12.5%	7,750	517
			9,892
2016 වර්ෂය සඳහා			
ලීබඩු හා සවිකිරීම්	20%	91,497	18,299
මෙවලම් හා උපකරණ	12.5%	30,255	3,782
			22,081
2015 වර්ෂය සඳහා			
මෙවලම් හා උපකරණ	12.5%	18,180	2,273
			2,273
2014 වර්ෂය සඳහා			
ලීබඩු හා සවිකිරීම්	20%	135,727	27,145
මෙවලම් හා උපකරණ	12.5%	26,245	3,281
			30,426
2018 වර්ෂයට අදාළ ප්‍රාග්ධන දීමනාව			**97,000**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවේ ඇතුලත් කරුණු පිළිබඳ කළමණාකරණ මණ්ඩලයේ අදහස් දැක්වීම්

1. මුල්‍ය ප්‍රකාශන

1.1. මතය

1.2. තත්වාගණනය කළ මතය සඳහා පදනම

1.2.1. ගිණුම්කරණ අඩුපාඩු

අ .ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් මෙම තෙල් ටැංකි දෙක තක්සේරු කර ගිණුම්ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

ආ.පිළිගනිමු .
2016 වර්ෂයේදී සංස්ථාව විසින් සිදු කල ඉල්ලීමකට අනුව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මෙම ඉඩම තක්සේරු කරන ලදි .
නමුත් ඊට අදාළ තක්සේරු ගාස්තුව රු. 22,985,800.ක් වන බව දන්වා ඇත-/ එම මුදල ගෙවීමට ප්‍රමාණවත් මුල්‍ය ශක්තියක් සංස්ථාව සතු නොවූ බැවින් අදාල තක්සේරුව ලබාගත නොහැකි විය.

ඇ .පුත්තලම ,පාලාවිහි පිහිටි මෙම ඉඩම සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කර තිබූ බැවින් ආයෝජන වත්කම් යටතේ නිරූපණය කරන ලදි.කටයුතු කරනු ලැබේ මෙය නිවැරදි කිරීමට .

1.2.2. ශ්‍රී ලංකා ගිණුම්කරණ හා වාර්තාකරණ ප්‍රමිත

<u>අ .ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 (LKAS 07)</u>
මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී අදාල ප්‍රමිතයේ සඳහන් අර්ථකථනයන්ට අනුව ආදායම් හඳුනාගැනීමට කටයුතු කරනු ලැබේ.

<u>ආ .ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 40 (LKAS 40)</u>
දේපල ප්‍රත්‍යාගණනයට අදාල මුල්‍ය පිරිවැය දැරීමට ප්‍රමාණවත් මුල්‍ය ප්‍රතිපාදන සපයා ගැනීම සම්බන්ධ ගැටලු හේතුවෙන් පැරණි අගයන්ට ආයෝජන දේපල ගිණුම්ගත කර ඇත.

<u>ඇ .ශ්‍රී ලංකා වාර්තාකරණ ප්‍රමිත 05 (SLFRS 05)</u>
පිළිගනිමු .ප්‍රමිතයේ සඳහන් අර්ථකථනයන්ට අනුව නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කරනු ලැබේ.

1.2.3. විගණනය සඳහා සාක්ෂි නොවීම

<u>අ .වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ</u>
මෙම ශේෂ සනාථන ලිපි අදාල ආයතන වෙත ලියාපදිංචි තැපැල මගින් යොමු කර ඒවායේ පිටපත් විගණනය සඳහා ඉදිරිපත් කරන ලදි .කිසිදු ආයතනයක් එම ශේෂ සනාථ කර හෝ විරෝධතාවයක් හෝ ඉදිරිපත් කර නොමැත.

<u>ආ වෙළඳ හා අනෙකුත් .ගෙවිය යුතු ශේෂ</u>
මෙම ශේෂ සනාථන ලිපි අදාල ආයතන වෙත ලියාපදිංචි තැපැල මගින් යොමු කර ඒවායේ පිටපත් විගණනය සඳහා ඉදිරිපත් කරන ලදි .කිසිදු ආයතනයක් එම ශේෂ සනාථ කර හෝ විරෝධතාවයක් හෝ ඉදිරිපත් කර නොමැත.

1.2.4. නොසැසඳු පාලන ගිණුම්
ස්ථාවර වත්කම් ලේඛනය 2016 වර්ෂයේදී සකස් කල අතර එය යාවත්කාලීන කර ඇතපිරිවැය නිවැරදිව . .හඳුනාගතහැකි වත්කම්වල පමණක් වටිනාකම සටහන් කර ඇත

1.2.5. ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් වාර්ෂිකව ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද , සංස්ථාවේ පරිපාලිත සමාගම වන සී/ස ලංකා සිමෙන්ති සමාගමේ201 8 වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකල බැවින් මෙම වර්ෂය සඳහා ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1. නීති රීති / විධානය

(i) මුදල් රෙගුලාසි 135

මුදල් පාලන කාර්යන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියද සහිතව පැවරීම සිදු කර ඇත.

(ii) මුදල් රෙගුලාසි 757(4)

2018 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදීනියමිත කාල රාමුව තුල මෙම කටයුතු සිදු කිරීමට කටයුතු ක .රනු ලැබේ.

2.2. බලතල ,කර්තව්‍ය ,කාර්යයන්

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තිය;

i. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් 2017.08.30 දිනෙන් පසු මේ දක්වා සිමෙන්ති ආනයනය හා අලෙවිය නතර කර ඇත.

ii. නිෂ්පාදනය කර ගොඩගසා තිබූ මෙම සිමෙන්ති කණු අපේක්ෂිත මිල ගනන් වලට මුළු ප්‍රමාණයම අලෙවිකල නොහැකි විය.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තිය;

අ ලංකා සිමෙන්ති සංස්ථාවේ පරිපාලිතය වන ලංකා සිමෙන්ති සමාගම ඇවර කිරීමට තිරණය කර ශ්‍රී . තිබෙන අතර එම සමාගමට අයත් සිමෙන්ති කර්මාන්තශාලාවේ යකඩ විකිණීමෙන් ලැබෙන මුදල් වලින් මෙම ණය මුදල ගෙවීම් කරන බව දන්වා ඇත.

ආනය කටයුතු පමණක් සිදු කරනු ලබන අතර එම මෙම අරුවක්කාලුහි පිහිටි ඉඩමේ තාක්ෂණික අධ්‍ය . .ඩෝ .නය කටයුතු සඳහා මෙම ඇඅධ්‍ය20,000/- ක මුදල සංස්ථාවට ගෙවා ඇත.

ඇකන්කසන්තුරේ පිහිටි තෙල් . ටැංකි සඳහා අයවිය යුතු මුදල් ලබාගැනීම සඳහා රේඛිය අමාත්‍යාංශයේද සහය ඇතිව කටයුතු කරගෙන යනු ලැබේ.

ඈ බැංකුවට ගෙවිය යුතු ණය මත .2018.12.31 දිනට තවදුරටත් ගෙවිය යුතු පොළිය සඳහන් කර බැංකු සනාථන ලිපිය ලබා දෙන ලදි ,තවද .2018 වර්ෂය තුලදී මාසිකව ණය මුදලට අදාළ පොළිය ගෙවීම් කර ඇත . වර්ෂය තුල ගෙවීම්කල පොළිය හා තවදුරටත්ගෙවිය යුතු වූ පොළිය සැලකිල්ලට ගෙන මෙම පොළී කපා හැරීම සිදු කරන ලදි.

ඉ.පිළිගනිමු .

ඊ.පිළිගනිමු .

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

ඉදිරියේදී අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර ඊට සේවකයෙකු අනුයුක්ත කිරීමට කටයුතු කරනු ලැබේ.